# संस्कृतभाषा

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

**මූලික පිරිවෙණ**

**2 ශ්‍රේණිය**

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Scanned by CamScanner

# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 2 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව


පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**



මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සංස්කෘත භාෂාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

2 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0504-1

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසෙකර මාවත,
කොළඹ 10

**පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තූතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තූතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම  ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා  නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තූතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පංති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **අධීක්‍ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**විෂය විශේෂඥ උපදේශනය** :

මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය** :

පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය රුපහ ඤාණරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
ගම්/ සාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම

පූජ්‍ය අබේසේකරගම විජිත හිමි
පරිවේණාධිපති, ගා/ ශ්‍රී රේවත මහ පිරිවෙණ
කුඹල්වැල්ල, ගාල්ල

පූජ්‍ය නෙල්ලිවල සිරිනන්ද හිමි
පරිවේණාචාර්ය
ගම්/ ශ්‍රී සුදර්ශන ධර්මායතන මූලික පිරිවෙණ
තිඹිරිගම, කිරිඳිවැල

ඩබ්. ලසන්ත කුමාර
පරිවේණාචාර්ය, ගම්/පද්මාවතී මහ පිරිවෙණ
කැරගල, හේනේගම

| | | |
|---|---|---|
| **භාෂා හා විෂය කරුණු සංස්කරණය** | : | මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br><br>පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| **සෝදුපත් කියැවීම** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | පූජ්‍ය නිග්ගහ ඤාණින්ද හිමි<br>කථිකාචාර්ය, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය<br>අවිස්සාවෙල්ල<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>පූජ්‍ය පුස්සැල්ලැවේ සීලවිසුද්ධි හිමි<br>ගුරු උපදේශක, නුඑ/ මන්තින්දාරාම විද්‍යායතන පිරිවෙණ<br>පුස්සැල්ලාව<br><br>පූජ්‍ය හක්මන විමලජෝති හිමි<br>පරිවෙණාධිපති, ර/ඇඹි/ශ්‍රී රෝහණ වනවාස මූලික<br>පිරිවෙණ, කඩමුදුන, බුළුතොට<br><br>පූජ්‍ය කන්තලේ නාගිත හිමි<br>පරිවේණාචාර්ය, කෑ/ සදර්ශෝදය මහ පිරිවෙණ<br>ඇදුරාපොත, දේවාලේගම |
| **පිටකවර නිර්මාණය** | : | ජේ. එම්. තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විවිධ සහාය** | : | පී. ජී. බී. බුද්ධිකා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් යී අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදාගැනීමට ප්‍රබල සටනක් ගෙන-ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් ඒ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගන්මිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන


| | පිටු අංකය |
|---|---|
| ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| ජාතික අරමුණු | xvi |
| මූලික නිපුණතා | xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xx |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxi |
| විෂය නිර්දේශය | xxiii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxi |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | |
| පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව | 3 |
| පාඩම 2 - නාමපද | 11 |
| පාඩම 3 - ක්‍රියාපද | 18 |
| පාඩම 4 - සන්ධි | 23 |
| පාඩම 5 - වාක්‍යනිර්මාණය - i | 28 |
| පාඩම 6 - වාක්‍යනිර්මාණය - ii | 32 |
| පාඩම 7 - නිර්දිෂ්ටග්‍රන්ථ - නාමාෂ්ටශතකය | 39 |
| පාඩම 8 - නිර්දිෂ්ටග්‍රන්ථ - ව්‍යාසකාරය | 42 |
| පාඩම 9 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත නාම වරනැගිල්ල | 44 |
| පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 2 | 47 |
| ඇගයීම හා තක්සේරුකරණය | 54 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

## සංස්කෘත භාෂාව

### විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 02 | I | 1.1, 2.1, 2.2, 2.3, 2.4, 3.1, 3.2 5.1, 5.2 | 60 |
| | II | 2.1, 2.2, 2.3, 2.4, 2.5, 2.6, 3.1, 3.2, 5.1, 5.6 | 60 |
| | III | 2.1, 2.2, 2.3, 2.4, 2.5, 2.6, 3.1, 3.2, 4.1, 5.2, 6.1 | 60 |
| | | එකතුව | 180 |

# संस्कृतपाठ्यक्रमः

## සංස්කෘත විෂය නිර්දේශය

## 2 ශ්‍රේණිය

**गु शब्दस्त्वन्धकारः स्यात् - रु शब्दस्तन्निरोधकः ।**
**अन्धकारनिरोधित्वात् - गुरुरित्यभिधीयते ॥**

'ගු' ශබ්දයෙන් අන්ධකාරය කියැවෙයි, 'රු' ශබ්දයෙන් ඒ අන්ධකාරය දුරු කිරීම කියැවෙයි,

'නො දැනීම' නමැති අඳුර දුරු කරන හෙයින් 'ගුරු' යැ යි කියනු ලැබේ.

# වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධිපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාසපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්තපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.** | 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරාක්ෂර සහ ව්‍යඤ්ජනාක්ෂර වර්ගීකරණය කරයි. | 1.1 ස්වර ප්‍රභේද සහ ව්‍යඤ්ජන ප්‍රභේද<br>• ස්වර ප්‍රභේද<br>• හ්‍රස්ව අක්ෂර<br>• දීර්ඝ අක්ෂර<br>• සන්ධ්‍යක්ෂර<br>(අනෙකුත් ප්‍රභේද හඳුන්වා දීම අපේක්ෂා නො කෙරේ.)<br><br>• ව්‍යඤ්ජන ප්‍රභේද<br>• අල්පප්‍රාණ<br>• මහාප්‍රාණ<br>• අන්තඃස්ථ<br>• අනුස්වාර<br>• ඌෂ්මාක්ෂර<br>• විසර්ග<br>(අනෙකුත් ප්‍රභේද හඳුන්වා දීම අපේක්ෂා නො කෙරේ.) | 1.1<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂරවල හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යනුවෙන් ප්‍රභේද තුනක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට වෙන්කර ලියයි.<br>• හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට අයත් ස්වරාක්ෂර සහිත වචන කියවයි; ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යනුවෙන් ප්‍රභේද හයක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යන ප්‍රභේද හයට අයත් ව්‍යඤ්ජනාක්ෂර සහිත වචන කියවයි; ලියයි.<br>• දේවනාගරී හෝඩිය භාවිත කරමින් එදිනෙදා පරිහරණය කරන සංස්කෘත වචන නිවැරදි ව ලියයි. | 25 |
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 නාම, ඒකවචන, ද්විවචන සහ බහුවචන ලෙස නිවැරදි ව වර්ග කරයි. | 2.1 නාමපද<br>• නාමපදවල පවතින වචනත්‍රය<br>• ඒකවචන<br>• ද්විවචන<br>• බහුවචන | 2.1<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද ප්‍රකාශ කරයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි. | 25 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • මාතෘභාෂාවේ ඇති නාමපද ඒකවචන සහ බහු වචන ලෙස වර්ග කිරීමත්, සංස්කෘත භාෂාවේ පවතින වචනත්‍රයත් සංසන්දනය කරයි.<br>• වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන වර්ග කර දක්වයි. | |
| | 2.2 ලිංග භේදයට අනුකූල ව වචන වර්ග කරයි. | 2.2 ලිංග භේදය<br>• පුරුෂ, ස්ත්‍රී, නපුංසක | 2.2<br>• එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් පෙළ ගස්වයි. | |
| | 2.3 නාමවල ශබ්ද මූලය වෙන් කරයි. | 2.3 නාමයක ශබ්දමූලය | 2.3<br>• දෙනු ලබන නාමපදයක ශබ්දමූලය වෙන් කර දක්වයි. | |
| | 2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි. | 2.4 විභක්ති<br>• ප්‍රථමා සහ ද්විතීයා<br>• අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග ශබ්ද<br>• ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද | 2.4<br>• එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.<br>• එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි. | |
| | 2.5 පුරුෂ භේදයට අනුකූල ව වචන වර්ග කරයි. | 2.5 පුරුෂ භේදය<br>• ප්‍රථමපුරුෂ<br>• මධ්‍යමපුරුෂ<br>• උත්තමපුරුෂ | 2.5<br>• එදිනෙදා භාවිත කරන ක්‍රියාපද ප්‍රථමපුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තමපුරුෂ වශයෙන් වාචික ව පෙළ ගස්වයි. | |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.6 අව්‍යයපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 2.6 අව්‍යය<br>• නිපාත<br>• උපසර්ග | 2.6<br>• සංස්කෘත භාෂාවේ අව්‍යයපද වර්ග දෙකක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• අව්‍යයපද වර්ග දෙක නම් කරයි.<br>• දෙනු ලබන ඡේදයක නිපාත සහ උපසර්ග ලෙස අව්‍යයපද වෙන් කර දක්වයි. | |
| **3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.** | 3.1 ආඛ්‍යාතවල ධාතුමූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියා පදයක) ධාතුමූලය වෙන් කර දක්වයි. | 30 |
| | 3.2 ලට් සහ ලඞ් ලකාරවල පරස්මෛපද නිවැරදි ව භාවිත කරයි. | 3.2 ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍යය සහිත ක්‍රියා පද<br>• ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය ධාතු සමග යෙදීම | 3.2<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් ආඛ්‍යාතපද යෝජනා කරයි. | |
| **4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.** | 4.1 සන්ධි සහිත වචන අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 4.1 සන්ධි<br>• ස්වරසන්ධි<br>• ව්‍යඤ්ජනසන්ධි<br>• අනුස්වාරසන්ධි<br>• විසර්ගසන්ධි<br>• ප්‍රකෘතිසන්ධි | 4.1<br>• සන්ධි වර්ග පහකින් යුතු පද ඇති බව ප්‍රකාශ කරයි.<br>• සන්ධි වර්ග පහ නම් කරයි.<br>• ස්වරසන්ධි, ව්‍යඤ්ජනසන්ධි, අනුස්වාරසන්ධි, විසර්ගසන්ධි සහ ප්‍රකෘතිභාවසන්ධි ලෙස දෙනු ලබන පදවල ඇති සන්ධි වර්ග කරයි. | 10 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **5.0** සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | 5.1 උක්තය, ආඛ්‍යාතය, කර්මය සහ නාම විශේෂණ ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 5.1 උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය<br>• උක්තය (නාමපදය) සහ ආඛ්‍යාතය (අවසාන ක්‍රියාව) | 5.1<br>• උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.<br>• උක්තය සහ ආඛ්‍යාතය ඇති සරල වාක්‍ය දීර්ඝ කරමින් කර්මය සහ නාමවිශේෂණ යොදයි. | 30 |
| | 5.2 පුරුෂභේදය සහ වචන භේදය සැලකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි. | 5.2 පුරුෂභේදය සහ වචන භේදය<br>• ප්‍රථමපුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තමපුරුෂ<br>• ඒකවචන, ද්විවචන, බහුවචන<br>* 'සංස්කෘත බාලාදර්ශයේ' 1 සිට 15 දක්වා පාඩම් යොදා ගනිමින් ඉහත විෂය කොටස් ආවරණය කිරීම අපේක්ෂා කෙරේ. | 5.2<br>• ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ, සහ උත්තමපුරුෂ ලෙස වෙන් කරයි.<br>• ප්‍රථමපුරුෂ හෝ මධ්‍යමපුරුෂ හෝ උත්තමපුරුෂ හෝ ආඛ්‍යාතය සහිත නිවැරදි සරල වාක්‍ය ගොඩනගයි.<br>• දෙනු ලබන වාක්‍යවල ආඛ්‍යාතය ඒකවචන, ද්විවචන, බහුවචන ලෙස වර්ග කර දක්වයි.<br>• ඒකවචන, ද්විවචන, බහුවචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි. | |
| **6.0** නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | 6.1 නිර්දිෂ්ට ග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 6.1.1 නාමාෂ්ටශතකය<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 (අර්ථාවබෝධය අපේක්ෂා නොකෙරේ.) | 6.1.1<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 දේවනාගරී අක්ෂරවලින් ලියයි. | 60 |

# 2 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 6.1.2 ව්‍යාසකාරය<br>• ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක | 6.1.2<br>• ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝක නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලියයි. | |
| | | 6.1.3 සංස්කෘත වරනැගිල්ල<br>• ඉකාරාන්ත පුංලිඞ්ග කවි ශබ්දය<br>• උකාරාන්ත පුංලිඞ්ග සාධු ශබ්දය<br>• අකාරාන්ත නපුංසකලිඞ්ග පුෂ්ප ශබ්දය<br>• ඍකාරාන්ත පුංලිඞ්ග පිතෘ ශබ්දය<br>• ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග වනිතා ශබ්දය (අනෙකුත් අන්ත සහිත නාම වරනැගීම අපේක්ෂා නොකෙරේ.) | 6.1.3<br>• කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද වාචෝද්ගත ව වරනගයි.<br>• කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද හා සමාන අන්ත ඇති අනෙකුත් නාම වරනැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | |
| | | 6.1.4 සංස්කෘත පාඨමාලා 2 | 6.1.4<br>• සංස්කෘත පාඨමාලා 2 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• නම් කරනු ලබන ව්‍යාකරණාංග සංස්කෘත පාඨමාලා 2 හි ඇතුළත් පාඩම්වලින් උපුටා දක්වයි. | |

## නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (2 ශ්‍රේණිය)

1. **නිර්දිෂ්ටග්‍රන්ථ**

- සංස්කෘත භාෂාව - 02,
  අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

- නාමාෂ්ටශතකය,
  පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම,
  නුගේගොඩ - 2005

- සංස්කෘත බාලාදර්ශය 01 - 15 පාඩම්,
  විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව - 2007

- ව්‍යාසකාරය (1 - 30 වන ශ්ලෝකය දක්වා)

- සංස්කෘත පාඨමාලා - 02,
  පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016

2. **පරිශීලනීය ග්‍රන්ථ**

- සංස්කෘත භාෂාව අකුරු ලියමු - (01) ප්‍රාචී අධ්‍යාපන ප්‍රකාශන,
  (සංයුක්ත තැටිය සහිත ව)

- භාෂණසංස්කෘතම් - පූජ්‍ය උඩවෙල රේවත හිමි, සමයවර්ධන මුද්‍රණාලය,
  මරදාන - 2010

- සරල සංස්කෘත ශික්ෂකය - 01, බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි,
  මොඩන් පොත් සමාගම, නුගේගොඩ - 2012

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග),
  පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික හා වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

## තක්සේරු හා ඇගැයීම් කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම්** වැඩපිළිවෙළ පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගැනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගැනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල් ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල් ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. '**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා**' ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන් ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නො වුව ද විෂමතා හඳුනා ගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලී විෂයයක් බවට පත් කිරීමටත්, එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත්, භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කළ යුතු ය. එ විට පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කෙරේ.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmisson Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) ගුරුවරයා අනුගමනය කරනු ඇතැ යි මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකු ගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඉගැනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන් ගේ ඉගැනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයා ගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂයය සමස්ත පිරිවෙන් පද්ධතියේ ප්‍රධාන සහ අනිවාර්ය භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගැනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වර අක්ෂර සහ ව්‍යඤ්ජනාක්ෂර වර්ගීකරණය කරයි.

**කාලච්ඡේද** : 25 යි.

**ඉගෙනුම් පල** :

- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂරවල හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යනුවෙන් ප්‍රභේද තුනක් ඇති බව ප්‍රකාශ කරයි.
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට වෙන්කර ලියයි.
- හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට අයත් ස්වරාක්ෂර සහිත වචන කියවයි; ලියයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යනුවෙන් ප්‍රභේද හයක් ඇති බව ප්‍රකාශ කරයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහා ප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යන ප්‍රභේද හයට අයත් ව්‍යඤ්ජනාක්ෂර සහිත වචන කියවයි; ලියයි.
- දේවනාගරී හෝඩිය භාවිත කරමින් එදිනෙදා පරිහරණය කරන සංස්කෘත වචන නිවැරදි ව ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 වගුව යොදා සකසාගත් පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- අක්ෂර යනු භාෂාවක වචන ලියා දක්වන සංකේත රූප බව පැහැදිලි කර දෙන්න.
- එම වගුව ඇසුරෙන් දේවනාගරී අක්ෂරමාලාව විවිධ බෙදීම්වලට භාජනය වන බව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 1 උපයෝගී කර ගනිමින් දේවනාගරී අක්ෂරමාලාවේ ස්වර අක්ෂර 14 සිසුන් සමග හඬ නගා කියවන්න.
- දේවනාගරී ස්වර අක්ෂරමාලාවේ මූලික බෙදීම් තුනක් ඇති බව ඇමුණුම 1 ඇසුරෙන් පෙන්වා දෙන්න.
- **හ්‍රස්ව, දීර්ඝ** සහ **සන්ධ්‍යක්ෂර** යන එම බෙදීම් හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- එම බෙදීම්වලට අයත් ස්වරාක්ෂර ද වෙන වෙන ම හුණු පුවරුවේ ලියා පෙන්වන්න.

- කෙටියෙන් කියැවෙන (එක් මාත්‍රාවක් ඇති) අක්ෂර **පහ ත්‍රස්ව** ස්වර බව පෙන්වා දෙන්න.
- දීර්ඝ ව කියැවෙන (මාත්‍රා දෙකක් ඇති) අක්ෂර **නවය දීර්ඝ** ස්වර බව පෙන්වා දෙන්න.
- දීර්ඝ ස්වර නවයෙන් **ए , ऐ , ओ , औ** යන අක්ෂර සන්ධ්‍යක්ෂර වශයෙන් හඳුන්වන බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 1 සහ 2 සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 2 මගින් **ත්‍රස්ව, දීර්ඝ, සන්ධ්‍යක්ෂර** සැදෙන අයුරු පෙන්වා දෙන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට බෙදා වෙන්කර ඒ ඒ කණ්ඩායම්වලට **ත්‍රස්ව, දීර්ඝ, සන්ධ්‍යක්ෂර** යන තේමා ලබාදෙන්න.
- කණ්ඩායමේ නම් කරන සිසුවකු හුණු පුවරුව වෙත කැඳවා ඒ ඒ කණ්ඩායම්වලට ලබා දෙන ස්වරය, අදාළ කොටසේ ලියවන්න.
- පෙළපොතේ 1.1, 1.2 සහ 2.1 අභ්‍යාස සහ ඇමුණුම 3 අභ්‍යාසය සිසුන් ලවා කරවන්න.

## පියවර 2

- ඇමුණුම 1 වගුව අනුව ව්‍යඤ්ජන අකුරු සිසුන් සමග කියවන්න.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, ඌෂ්මාක්ෂර, අනුස්වාර, විසර්ග වශයෙන් කොටස් **හයකට** ව්‍යඤ්ජන බෙදෙන බව පෙන්වන්න.
- ව්‍යඤ්ජන අකුරුවලින් මුල් අකුරු විසිපහ වර්ගාක්ෂර බවත්, ඒවා වර්ග පහකට බෙදෙන බවත් පෙන්වා දෙන්න.
- කවර්ග, චවර්ග, ටවර්ග, තවර්ග, පවර්ග වශයෙන් වර්ගාක්ෂර කොටස් පහකට බෙදී ඇති අයුරු පෙන්වා දෙන්න.
- වර්ගාක්ෂරවල මුල් අකුරු පහ යොදා ගනිමින් ඒ ඒ වර්ග **क** වර්ග **च** වර්ග ආදි වශයෙන් නම් කරන බව පෙන්වා දෙන්න.
- වර්ගාක්ෂරවල **क च ट त प** හා **ग ज ड द ब** යන අකුරු 10 අල්පප්‍රාණයකින් උච්චාරණය වන බැවින් **අල්පප්‍රාණ** ලෙස හඳුන්වන බව පෙන්වා දෙන්න.
- වර්ගාක්ෂරවල **ख छ ठ थ फ** හා **घ झ ढ ध भ** යන අකුරු 10 මහාප්‍රාණයකින් උච්චාරණය වන බැවින් **මහාප්‍රාණ** ලෙස හඳුන්වන බව පෙන්වා දෙන්න.
- **य व र ल** යන අකුරු හතර **අන්තඃස්ථ** ලෙස හඳුන්වන බව පෙන්වා දෙන්න.
- **श ष स ह** යන අකුරු හතර **ඌෂ්මාක්ෂර** ලෙස හඳුන්වන බව පෙන්වා දෙන්න.
- ං (බින්දුව) අනුස්වාරය ලෙසත්, උඩ යට සිටින සේ ඃ (බින්දුදෙක) විසර්ගය ලෙසත් පෙන්වා දෙන්න.

## පියවර 3

- සංස්කෘත අක්ෂරමාලාවේ සියලු දේවනාගරී අක්ෂර ඇතුළත් අඟල් 3 x 3 ප්‍රමාණයේ කාඩ්පත් 49 සිසුන් ලවා සකස් කරවන්න. **(මෙහි සිංහල අකුරු ඇතුළත් නොකරන්න.)**
- ව්‍යඤ්ජන ප්‍රභේදයක් ප්‍රකාශ කොට එයට අදාළ අකුරු පෙන්වීමට සිසුන් මෙහෙයවන්න.

- එක් එක් සිසුවා හුණු පුවරුව වෙත කැඳවා ප්‍රකාශ කරන ලද ව්‍යඤ්ජන ප්‍රභේදයකට අයත් අකුරු ලියවන්න.
- ඇමුණුම 4 සහ 5 අභ්‍යාසය කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යනුවෙන් දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂරවල ප්‍රභේද තුනක් ඇති බව ප්‍රකාශ කිරීම
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර හ්‍රස්ව, දීර්ඝ සහ සන්ධ්‍යක්ෂර යන ප්‍රභේද තුනට වෙන් කර දැක්වීම
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යනුවෙන් ප්‍රභේද හය නම්කර දැක්වීම
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂරවල අල්පප්‍රාණ, මහාප්‍රාණ, අන්තඃස්ථ, අනුස්වාර, ඌෂ්මන්, විසර්ග යන ප්‍රභේද හයට අයත් අකුරු වෙන් වෙන් ව ලියා දැක්වීම
- දේවනාගරී හෝඩිය භාවිත කරමින් එදිනෙදා පරිහරණය කරන සංස්කෘත වචන නිවැරදි ව ලිවීම හා කියවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම - 1, 2, 3, 4 සහ 5
- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත අක්ෂරමාලාවේ සියලු අකුරු ලිවීමට යොදාගනු ලබන අඟල් 3 x 3 කාඩ්පත්

## ස්වර අක්ෂරමාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හ්‍රස්ව | अ | इ | उ | ऋ | ऌ | |
| දීර්ඝ | आ | ई | ऊ | ॠ | ॡ | |
| | ए | ऐ | ओ | औ | | සන්ධ්‍යක්ෂර |

## ව්‍යඤ්ජන අක්ෂරමාලාව

| | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අල්පප්‍රාණ | |
|---|---|---|---|---|---|---|
| කවර්ග | क | ख | ग | घ | ङ | වර්ගාක්ෂර |
| චවර්ග | च | छ | ज | झ | ञ | |
| ටවර්ග | ट | ठ | ड | ढ | ण | |
| තවර්ග | त | थ | द | ध | न | |
| පවර්ග | प | फ | ब | भ | म | |
| | | | | | වර්ගාන්ත | |
| අන්තඃස්ථ | य | व | र | ल | | |
| උෂ්මන් | श | ष | स | ह | | |

| | |
|---|---|
| අනුස්වාර | ं – (अं) |
| විසර්ග | ඃ – (अः) |

ඇමුණුම 2

| හ්‍රස්වස්වර | දීර්ඝස්වර | සන්ධ්‍යක්ෂර |
|---|---|---|
| अ = අ | अ + अ = आ > ආ | अ + इ = ए > ඒ |
| इ = ඉ | इ + इ = ई > ඊ | अ + ए = ऐ > ඓ |
| उ = උ | उ + उ = ऊ > ඌ | अ + उ = ओ > ඕ |
| ऋ = ඍ | ऋ + ऋ = ॠ > ඎ | अ + ओ = औ > ඖ |
| ऌ = ඏ | ऌ + ऌ = ॡ > ඐ | අවබෝධය සඳහා උදාරණයක් පමණි. |
| | ए > එ | भव+ इन्द्र = भवेन्द्र |
| | ऐ > ඓ | तव+ एषा = तवैषा |
| | ओ > ඕ | पर + उपकार = परोपकार |
| | औ > ඖ | तव+ ओदन = तवौदन |

ඇමුණුම 3

❖ පහත වගුවේ ස්වරප්‍රභේද ලියා දක්වන්න.

| හ්‍රස්වස්වර | දීර්ඝස්වර | සන්ධ්‍යක්ෂර |
|---|---|---|
| | | |

| | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අල්පප්‍රාණ |
|---|---|---|---|---|---|
| කවර්ග | | | | | |
| චවර්ග | | | | | |
| ටවර්ග | | | | | |
| තවර්ග | | | | | |
| පවර්ග | | | | | |
| අන්තඃස්ථ | | | | | |
| ඌෂ්මන් | | | | | |
| | | | | | |
| අනුස්වාර | | | | | |
| විසර්ග | | | | | |

වර්ගාක්ෂර

වර්ගාන්ත

- ❖ පහත කොටුව තුළ ඇති අකුරු ගෙන ඉහත වගුව නිවැරදි ව පුරවන්න.
- ❖ වගුව පිරවීමේ දී ව්‍යඤ්ජන ප්‍රභේදවලට අයත් ඇතැම් අකුරු ලියැවී නැත. එම අකුරු අයත් අදාළ ව්‍යඤ්ජන ප්‍රභේද ලියා දක්වන්න.

උදා :- **කවර්ග - මහාප්‍රාණ = ඛ**

| | | | | | |
|---|---|---|---|---|---|
| क | ग | ढ | ण | ड | |
| च | थ | द | ब | म | ठ |
| त | न | ज | ञ | घ | ह |
| फ | य | ल | स | ङ | ඃ |

## ඇමුණුම 5

01. ස්වර ප්‍රභේදවලට අයත් වන්නෙකි.

1. සන්ධ්‍යක්‍ෂර 2. ඌෂ්මාක්‍ෂර 3. අන්තඃස්ථ

02. හ්‍රස්ව ස්වරාක්‍ෂර

1. 5 කි. 2. 8 කි. 3. 9 කි.

03. සන්ධ්‍යක්‍ෂර පමණක් අයත් වන්නේ,

1. ए ऐ ओ औ। 2. ए ऋ ओ औ। 3. ए ऐ ओ छ।

04. දීර්ඝ අක්‍ෂර පමණක් අයත් වන්නේ,

1. आ ई ओ औ। 2. आ ऊ ओ अं। 3. आ ऐ ओ अः।

05. අල්පප්‍රාණාක්‍ෂර පමණක් අයත් වන්නේ,

1. क ग त च। 2. क ध त च। 3. क थ त च।

06. මහා ප්‍රාණාක්‍ෂර

1. 10 කි. 2. 12 කි. 3. 15 කි.

07. අන්තඃස්ථාක්‍ෂර පමණක් අයත් වන්නේ,

1. य र ल व। 2. य र ल ब। 3. थ र ल व।

08. ඌෂ්මාක්‍ෂර පමණක් අයත් වන්නේ,

1. श ष स ह। 2. श ष स ल। 3. श ष स ण।

09. විසර්ගය යෙදුණු වචනයක් වන්නේ,

1. विहगः। 2. वार्ता। 3. अङ्क

10. හ්‍රස්ව ස්වරාක්‍ෂර පමණක් යෙදුණු වචනයක් වන්නේ,

1. अनल। 2. आकाश। 3. औषध।

11. දීර්ඝ ස්වරාක්‍ෂර පමණක් යෙදුණු වචනයක් වන්නේ,

1. नौका। 2. उदक। 3. गिरि।

12. අනුස්වාරය යෙදුණු වචනයක් වන්නේ,

1. **गंगा।** 2. **नमः।** 3. **खनित्र।**

13. ඉදානීම් යන්නෙහි නිවැරදි දේවනාගරී වචනය වන්නේ,

1. **इदानीम्।** 2. **इधानिम्।** 3. **इदनीमि।**

14. **ऐरावण** යන්නෙහි නිවැරදි සිංහල වචනය වන්නේ,

1. ඓරාවණ 2. එරාවන 3. ඓරාවන

15. **अं** යන්න අයත් වන්නේ,

1. ව්‍යඤ්ජනවලට ය. 2. ස්වරවලට ය. 3. දෙකට ම ය.

16. මහාප්‍රාණාක්ෂරයක් යෙදුණු දේවනාගරී වචනයක් වන්නේ,

1. **आभरण।** 2. **आचरण।** 3. **आकाश।**

17. **श** ...... ...... **ह** හිස්තැනට අයත් නිවැරදි අක්ෂර පිළිවෙළින් යෙදෙන්නේ,

1. **ष स।** 2. **स ष।** 3. **स ळ।**

18. පවර්ගයට අයත් අක්ෂර යෙදී ඇති වරණය වන්නේ,

1. **प ब म।** 2. **प व ण।** 3. **प भ न।**

19. දේවනාගරී අක්ෂරමාලාවේ මුළු අක්ෂර ගණන වන්නේ,

1. 49 කි. 2. 26 කි. 3. 54 කි.

20. දේවනාගරී අක්ෂරමාලාවේ ව්‍යඤ්ජන අක්ෂර ගණන වන්නේ,

1. 35 කි. 2. 36 කි. 3. 41 කි.

# පාඩම 2 - නාමපද

**නිපුණතාව** : 2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 නාම, ඒකවචන, ද්විවචන සහ බහුවචන වශයෙන් නිවැරදි ව වර්ග කරයි.

2.2 ලිඞ්ගභේදයට අනුකූල ව වචන වර්ග කරයි.

2.3 නාමවල ශබ්දමූලය වෙන් කරයි.

2.4 නාමයක් ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවලට අනුව වරනගයි.

2.5 පුරුෂභේදයට අනුකූල ව වචන වර්ග කරයි.

2.6 අව්‍යයපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි.

**කාලච්ඡේද** : 25 යි.

**ඉගෙනුම් පල** :

- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද ප්‍රකාශ කරයි.
- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන නාමපද සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි.
- මාතෘභාෂාවේ ඇති නාමපද ඒකවචන සහ බහුවචන වශයෙන් වර්ග කිරීමත්, සංස්කෘත භාෂාවේ පවතින වචනත්‍රයත් සංසන්දනය කරයි.
- වචනත්‍රයට අනුව එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන වර්ග කර දක්වයි.
- එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් පෙළගස්වයි.
- දෙනු ලබන නාමපදයක ශබ්දමූලය වෙන්කර දක්වයි.
- එදිනෙදා භාවිත කරන අකාරාන්ත පුංලිඞ්ග සහ නපුංසකලිඞ්ග නාම, ප්‍රථමා, ද්විතීයා විභක්තිවල වරනගයි.
- එදිනෙදා භාවිත කරන ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම, ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල වරනගයි.
- එදිනෙදා භාවිත කරන ක්‍රියාපද ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ, උත්තමපුරුෂ වශයෙන් වාචික ව පෙළ ගස්වයි.
- සංස්කෘත භාෂාවේ අව්‍යයපද වර්ග දෙකක් ඇති බව ප්‍රකාශ කරයි.
- අව්‍යයපද වර්ග දෙක නම් කරයි.
- දෙනු ලබන ඡේදයක නිපාත සහ උපසර්ග ලෙස අව්‍යයපද වෙන් කර දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පෙළ පොත භාවිතයෙන් පුද්ගලයකු, සතකු, ස්ථානයක්, ද්‍රව්‍යයක් ආදිය හැඳින්වීමට යොදා ගන්නා ශබ්දරූප නාමපද නම් වන බව කියා දී ඒවාට එක උදාහරණය බැගින් පෙන්වා දෙන්න.
- එම නාමපද ඒකවචන, ද්විවචන හා බහුවචන යන වචනත්‍රයේ වරනගා පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**

පියවර 1

- මාතෘභාෂාවේ ඇති නාමපද ඒකවචන සහ බහුවචන වශයෙන් ප්‍රථමාවිභක්තියේ වරනැගෙන ආකාරය පෙන්වා දෙන්න. (ඇමුණුම 1)
- සංස්කෘත නාම වරනැගිල්ල සුදුසු පරිදි යොදා ගන්න.

පියවර 2

- එදිනෙදා භාවිත කරන සංස්කෘත වචන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් පෙළ ගස්වන්න. (ඇමුණුම 2)
- සංස්කෘත නාම වරනැගිල්ල සුදුසු පරිදි යොදා ගන්න.

පියවර 3

- එදිනෙදා භාවිත කරන ඉකාරාන්ත සහ උකාරාන්ත පුංලිඞ්ග නාමපදත්, අකාරාන්ත නපුංසකලිඞ්ග නාමපදත්, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාමපදත්, ප්‍රථමා, ද්විතීයා විභක්තිවල වරනැගෙන ආකාරය පෙන්වා දෙන්න. (ඇමුණුම 3)
- සංස්කෘත නාම වරනැගිල්ල සුදුසු පරිදි යොදා ගන්න.

පියවර 4

- **ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ සහ උත්තමපුරුෂ වශයෙන්** සංස්කෘත භාෂාවේ පුරුෂ තුනක් ඇති බව පෙන්වා දෙන්න.
- පුරුෂ තුනෙහි නාමපද ක්‍රියාපද සමග යෙදෙන ආකාරය පෙන්වා දෙන්න. (ඇමුණුම 4)

පියවර 5

- සියලු ම ලිඞ්ගවල, සියලු ම විභක්තිවල සහ සියලු ම වචනවල එක ම රූපයෙන් පෙනී සිටින වරනොනැගෙන ශබ්ද අව්‍යය ලෙස හඳුන්වා දෙන්න.
- **නිපාත හා උපසර්ග** වශයෙන් සංස්කෘත භාෂාවේ අව්‍යයපද දෙකක් ඇති බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 5 හි සඳහන් වාක්‍යවල හා ඡේදයේ සඳහන් වන අව්‍යයපද සෙවීමට සිසුන් යොමු කරවන්න

## පියවර 6

- නිශ්චිත සංඛ්‍යාවක් නොමැති, නොයෙක් අර්ථයන්හි යෙදෙන ශබ්ද සමූහය නිපාත නම් වන බව හඳුන්වා දෙන්න.
- සංස්කෘත භාෂාවේ යෙදෙන පහත සඳහන් නිපාතපද පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
  **यत्र** (යම් තැනක), **तत्र** (එහි), **कुत्र** (කොහි), **अत्र** (මෙහි), **अन्यत्र** (අන්තැනක), **यदा** (යම් දිනක), **तदा** (එදින), **कदा** (කවරදා), **एकदा** (එක් දිනක්), **च** (ද), **अपि** (ත්), **अद्य** (අද), **श्वः** (හෙට), **ह्यः** (ඊයේ), **प्रातः** (උදෑසන), **सायं** (සවස), **अधुना** (දැන්), **एव** (ම), **उपरि** (මත්තෙහි), **बहिः** (පිටත)

## පියවර 7

- ධාතුවකට හෝ නාමයකට මුලින් එකතුවන ශබ්ද උපසර්ග නම් වන බව හඳුන්වා දෙන්න.
- සංස්කෘත භාෂාවේ යෙදෙන පහත සඳහන් උපසර්ගපද පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
  **प्र, परा, अपि, सम्, अनु, अव, निस्, निर्, दुस्, दुर, वि, आ, नि, अधि, अपि, अति, सु, उत्, अभि, प्रति, परि, उप**

  නිද - **आगच्छति  विहरति  प्रहरति  प्रक्षालयति  पराभवति**
- ඇමුණුම 5 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- සංස්කෘත භාෂාවේ වචනත්‍රය සහ ලිඞ්ගත්‍රය ප්‍රකාශ කිරීම
- එදිනෙදා භාවිත වන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග ශබ්ද වෙන් කර දැක්වීම
- නාමපදයක ශබ්දමූලය ප්‍රකාශ කිරීම
- ඉකාරාන්ත, උකාරාන්ත පුංලිඞ්ග නාමපද, අකාරාන්ත නපුංසකලිඞ්ග නාමපද සහ ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාමපද ප්‍රථමා සහ ද්විතීයා විභක්තිවල ලිඛිත ව හා වාචික ව වරනැගීම
- උක්තයට ගැළපෙන ආඛ්‍යාතපද නිවැරදි ව යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- සංස්කෘත භාෂාවේ ඇති අව්‍යයපද දෙක නම් කිරීම
- ඡේදයක් හෝ වාක්‍ය කිහිපයක් දුන් විට එහි ඇතුළත් අව්‍යයපද වෙන් කොට දැක්වීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම - 1,2,3,4 සහ 5
- සංස්කෘත නාම වරනැගිල්ල
- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

| मूलशद्ब | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक | बालकः | बालकौ | बालकाः |
| मुनि | मुनिः | मुनी | मुनयः |
| गुरु | गुरुः | गुरू | गुरवः |
| फल | फलम् | फले | फलानि |
| लता | लता | लते | लताः |

ඇමුණුම 2

සංස්කෘත භාෂාවේ එදිනෙදා භාවිත වන ලිඞ්ගත්‍රයට අයත් නාම එකතුවක්

| පුංලිඞ්ග | | ස්ත්‍රීලිඞ්ග | | නපුංසකලිඞ්ග | |
|---|---|---|---|---|---|
| ශබ්ද මූලය | නාමපදය | ශබ්ද මූලය | නාමපදය | ශබ්ද මූලය | නාමපදය |
| अश्व | अश्वः - අශ්වයා | आशा | आशा - ආශාව | अम्बर | अम्बरम् - අහස |
| आचार्य | आचार्यः - ගුරුවරයා | कुञ्चिका | कुञ्चिका - යතුර | अनृत | अनृतम् - බොරුව |
| आदर्श | आदर्शः - කැඩපත | धरा | धरा - පොළොව | अध्ययन | अध्ययनम् - ඉගෙනීම |
| काक | काकः - කපුටා | नासा | नासा - නාසය | आभरण | आभरणम् - ආභරණය |
| कीट | कीटः - පණුවා | नौका | नौका - නැව | औषध | औषधम् - බෙහෙත් |
| कोविद | कोविदः - දක්ෂයා | पेटिका | पेटिका - පෙට්ටිය | कलत्र | कलत्रम् - බිරිඳ |
| चित्रक | चित्रकः - කොටියා | भार्या | भार्या - භාර්යාව | कलेवर | कलेवरम् - ශරීරය |
| नाविक | नाविकः - නැවියා | मेधा | मेधा - නුවණ | काव्य | काव्यम् - කාව්‍යය |
| अन्तक | अन्तकः - යමරජු | वार्ता | वार्ता - වාර්තාව | चक्र | चक्रम् - රෝදය |
| भेक | भेकः - ගෙම්බා | शुण्डा | शुण्डा - හොඬවැල | छत्र | छत्रम् - කුඩය |

ඇමුණුම 3

| ඉකාරාන්ත හා උකාරාන්ත පුංලිඞ්ග ශබ්ද | | | | |
|---|---|---|---|---|
| शब्द | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
| मुनि | प्रथमा | मुनिः | मुनी | मुनयः |
| | द्वितीया | मुनिम् | मुनी | मुनीन् |
| साधु | प्रथमा | साधुः | साधू | साधवः |
| | द्वितीया | साधुम् | साधू | साधून् |
| ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද | | | | |
| वनिता | प्रथमा | वनिता | वनिते | वनिताः |
| | द्वितीया | वनिताम् | वनिते | वनिताः |
| අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද | | | | |
| फल | प्रथमा | फलम् | फले | फलानि |
| | द्वितीया | फलम् | फले | फलानि |

ඇමුණුම 4

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | सः / सा / तत् } पतति | तौ / ते / ते } पततः | ते / ताः / तानि } पतन्ति |
| मध्यमपुरुष | त्वं → पतसि | युवां → पतथः | यूयं → पतथ |
| उत्तमपुरुष | अहं → पतामि | आवां → पतावः | वयं → पतामः |

१. सः सिंहः इव अवदत्।

२. मेघाः उच्चैः गर्जन्ति।

३. इदानीम् अहं पठामि।

४. सम्प्रति देवालयं गच्छ।

नक्षत्राणि कदा प्रकाशन्ते। नक्षत्राणि रात्रौ प्रकाशन्ते। तानि दिवा न प्रकाशन्ते। मेघैः आवृते नभसि रात्रौ च न प्रकाशन्ते। यदा सूर्यः अस्तम् अयते तदा ताराणि प्रकाशन्ते। तानि व्योम्नि हीरवत् द्योतन्ते। नक्षत्राणां राजा चन्द्रः। चन्द्रस्य प्रकाशः चन्द्रिका। अहं नक्षत्राणि गणयामि। किन्तु तानि गणयितुं न पारयामि। तानि असङ्ख्यानि वर्तन्ते। तत्र अश्विन्यादीनि सप्तविंशतिः नक्षत्राणि प्रधानानि॥

# පාඩම 3 - ක්‍රියාපද

**නිපුණතාව** : 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1 ආඛ්‍යාතවල ධාතුමූලය වෙන් කරයි.
**3.2** ලට් සහ ලඞ් ලකාරවල පරස්මෛපද නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 30 යි.

**ඉගෙනුම් පල :**

- දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය වෙන් කර දක්වයි.
- දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට් සහ ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.
- දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් ආඛ්‍යාතපද යෝජනා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

**चटक चटक रे चटक ॥**
**चिव् चिव् कूजसि त्वं विहग ॥**
**नीडे निवससि सुखेन डयसे**
**खादसि फलानि मधुराणि ॥**
**विहरसि विमले विपुले गगने ॥**
**नास्ति जनः खलु वारयिता ॥**
**चटक चटक रे चटक ॥**

- පාඨමාලා 2 පොතේ සඳහන් මෙම ගීතය සජ්ඣායනා කරන්න.
- එහි සඳහන් වන ක්‍රියාපද සිංහලට පරිවර්තනය කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1 :**

- ඇමුණුම 1 සිසුන්ට සපයා, එහි ඇති ක්‍රියාපදවල ධාතුමූලය වෙන් කර පෙන්වන්න.
- එය නිවැරදි ව උච්චාරණය කරමින් කට පාඩම් කිරීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 2හි ඇති පින්තූර සිසුන්ට ලබා දී ඒවා ආශ්‍රයෙන් වාක්‍ය නිර්මාණය කරවන්න.
- පහත 1හි දී ඇති සරල වාක්‍ය 12 හුණු පුවරුවේ ලියා, ඒ අනුසාරයෙන් 2හි දී ඇති ක්‍රියාපදවලට හැකිතාක් වාක්‍ය සෑදීමට සිසුන් යොමු කරවන්න.

1. १. सः धावति। ඔහු දුවයි. ७. त्वं धावसि। නුඹ දුවහි.
२. तौ धावतः। ඔවුහු (දෙදෙන) දුවත්. ८. युवां धावथः। නුඹලා (දෙදෙන) දුවහු.
३. ते धावन्ति। ඔවුහු දුවති. ९. यूयं धावथ। නුඹලා දුවහු.
४. बालकः धावति। ළමයා දුවයි. १०. अहं धावामि। මම දුවමි.
५. बालकौ धावतः। ළමයි (දෙදෙන) දුවත්. ११. आवां धावावः। අපි (දෙදෙන) දුවමු.
६. बालकाः धावन्ति। ළමයි දුවති. १२. वयं धावामः। අපි දුවමු.

2. √वद् - वदति (කියයි) √ताड् - ताडयति (තළයි) √हृ - हरति (ගෙනයයි)
√जि - जयति (දිනයි) √चर्- चरति (හැසිරෙයි) √गै - गायति (ගයයි)

- ඇමුණුම 3හි සඳහන් වර්තමාන කාල හා අතීතකාල සරල වාක්‍ය හුණු පුවරුවේ ලියන්න.
- එම වාක්‍ය සාමූහික ව ශබ්දනගා කියවා ඒ අනුසාරයෙන් අලුත් වාක්‍ය නිර්මාණයට සිසුන් යොමු කරවන්න.
- පෙළපොතේ 7 සහ 13 පාඩම්වලට අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 4 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්පය :**

- ලට්, ලඞ්
- පරස්මෛපද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- උක්තය සමග ලට් හා ලඞ් පරස්මෛපද ක්‍රියාපද මතකයෙන් ප්‍රකාශ කිරීම
- ලට් හා ලඞ් පරස්මෛපද ක්‍රියාපදවල ධාතුමූලය උපුටා දැක්වීම
- ලට් හා ලඞ් පරස්මෛපද ක්‍රියාපද යොදා පින්තූර ආශ්‍රයෙන් වාක්‍ය නිර්මාණය කිරීම
- වර්තමානකාල ක්‍රියාපද අතීතකාලයටත්, අතීතකාල ක්‍රියාපද වර්තමානකාලයටත් පරිවර්තනය කිරීම
- පුරුෂත්‍රයෙහි ම වර්තමාන හා අතීතකාල සරල වාක්‍ය නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**


- ඇමුණුම - 1,2,3 සහ 4
- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා - 2

ඇමුණුම 1


උක්ත පද සමග √गम् ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | सः गच्छति ।<br>ඔහු යයි. | तौ गच्छतः ।<br>ඔවුහු (දෙදෙන) යති. | ते गच्छन्ति ।<br>ඔවුහු යති. |
| मध्यमपुरुष | त्वं गच्छसि ।<br>නුඹ යහි. | युवां गच्छथः ।<br>නුඹලා (දෙදෙන) යහු. | यूयं गच्छथ ।<br>නුඹලා යහු. |
| उत्तमपुरुष | अहं गच्छामि ।<br>මම යමි. | आवां गच्छावः ।<br>අපි (දෙදෙන) යමු. | वयं गच्छामः ।<br>අපි යමු. |


ඇමුණුම 2



बालकः किं करोति ।



अश्वौ किं कुरुतः ।



कुक्कुराः किं कुर्वन्ति ।

ඇමුණුම 3

१. सः धावति। ඔහු දුවයි. १. सः अधावत्। ඔහු දිව්වේ ය.

२. तौ धावतः। ඔවුහු (දෙදෙන) දුවත්. २. तौ अधावताम्। ඔවුහු (දෙදෙන) දිව්වෝ ය.

३. ते धावन्ति। ඔවුහු දුවති. ३. ते अधावन्। ඔවුහු දිව්වෝ ය.

४. बालकः धावति। ළමයා දුවයි. ४. बालकः अधावत्। ළමයා දිව්වේ ය.

५. बालकौ धावतः। ළමයි (දෙදෙන) දුවති. ५. बालकौ अधावताम्। ළමයි (දෙදෙන) දිව්වෝ ය.

६. बालकाः धावन्ति। ළමයි දුවති. ६. बालकाः अधावन्। ළමයි දිව්වෝ ය.

७. त्वं धावसि। නුඹ දුවහි. ७. त्वम् अधावः। නුඹ දිව්වෙහි.

८. युवां धावथः। නුඹලා (දෙදෙන) දුවහු. ८. युवाम् अधावतम्। නුඹලා (දෙදෙන) දිව්වෙහු.

९. यूयं धावथ। නුඹලා දුවහු. ९. यूयम् अधावत। නුඹලා දිව්වෙහු.

१०. अहं धावामि। මම දුවමි. १०. अहम् अधावम्। මම දිව්වෙමි.

११. आवां धावावः। අපි (දෙදෙන) දුවමු. ११. आवाम् अधावाव। අපි (දෙදෙන) දිව්වෙමු.

१२. वयं धावामः। අපි දුවමු. १२. वयम् अधावाम। අපි දිව්වෙමු.

ඇමුණුම 4

√पच् ධාතුව ( अपचत् ) අතීතකාල (ලඞ්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | अपचत् | | अपचन् |
| मध्यमपुरुष | | अपचतम् | |
| उत्तमपुरुष | | अपचाव | |

√पत् ධාතුව ( पतति ) වර්තමානකාල (ලට්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | पतति | | पतन्ति |
| मध्यमपुरुष | | पतथः | |
| उत्तमपुरुष | | पतावः | |

√नी ධාතුව ( अनयत् ) අතීතකාල (ලඞ්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | | अनयताम् | |
| मध्यमपुरुष | | | अनयत |
| उत्तमपुरुष | अनयम् | | अनयाम |

√नी ධාතුව ( नयति ) වර්තමානකාල (ලට්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | | नयतः | |
| मध्यमपुरुष | नयसि | | नयथ |
| उत्तमपुरुष | | | नयामः |

# පාඩම 4 - සන්ධි

**නිපුණතාව** : 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 සන්ධි සහිත වචන අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- සන්ධි වර්ග පහකින් යුතු පද ඇති බව ප්‍රකාශ කරයි.
- සන්ධි වර්ග පහ නම් කරයි.
- ස්වරසන්ධි, ව්‍යඤ්ජනසන්ධි, අනුස්වාරසන්ධි, විසර්ගසන්ධි සහ ප්‍රකෘතිභාවසන්ධි ලෙස දෙනු ලබන පදවල ඇති සන්ධි, වර්ග කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ශරීරයෙහි අස්ථි එක් ව බැඳෙන ස්ථාන දක්වා ඒවා සන්ධි යනුවෙන් හඳුන්වන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- කථා ව්‍යවහාරයෙහි පවතින හන්දි, සන්ධි යන වචන උපයෝගී කොටගෙන නිදසුන් කිහිපයක් දක්වමින් සන්ධි යන වචනයේ අර්ථය සාකච්ඡා කරන්න.
- හතරමං හන්දිය, දෙමං හන්දිය, හන්දියෙ කඩේ, ඇඟ පුටු ආදියෙහි සන්ධි ආදිය පිළිබඳ ඉඟි ලබා දෙන්න.
- සන්ධිපද ඕනෑ ම භාෂාවක් තුළ දැකිය හැකි බවත්, භාෂාවක සුබෝච්චාරණය සඳහා සන්ධි පද යෙදීම නිරායාසයෙන් සිදුවන ක්‍රියාවලියක් බවත් සිසුන්ට පෙන්වා දෙන්න.
- පහත පරිදි සාරස්වතයේ සහ සිදත්සඟරාවේ සන්ධි පිළිබඳ ඇති විස්තර කිරීම සිසුන්ට ඉදිරිපත් කරන්න.

  **පූර්වාපරවර්ණයොඃ සන්ධානඃ සන්ධිඃ**

  **(පූර්ව අපර වර්ණයන් මැනැවින් ගැළපීම සන්ධි නම් වේ.) (සාරස්වතය)**

  **පෙරපර වණන් නිසිවිදිනි ගළපනු සඳ නම් (සිදත්සඟරාව)**

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සිංහල භාෂාවෙහි ව්‍යවහාරයෙහි පවතින සන්ධිපද කිහිපයක් නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ඇමුණුම 1)

- සිංහල භාෂාවෙහි මෙන් ම සංස්කෘත භාෂාවෙහි ද සන්ධිපද ඇති බව පහත සඳහන් ශ්ලෝකය ඇසුරෙන් පෙන්වා දෙන්න.

धर्मो जयति नाधर्मः सत्यं जयति नानृतम् ।
क्षमा जयति न क्रोधो देवो जयति नासुरः ॥

- සංස්කෘත භාෂාවේ නිතර හමුවන සන්ධිපද කිහිපයක් සිසුන්ට හඳුන්වා දෙන්න.

**गमनागमन । जनाधिपति । परिवेणाधिपति । पुस्तकालय । पुस्तकालयाधिपति । कार्यालय । शालाधिपति ।**

- පූර්වාපර වර්ණයන් ගැළපීමෙන් සන්ධිපද නිර්මාණය වන බව සංස්කෘත සන්ධිපදයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

सूर्य + आलोक (විසන්ධිපදය)

सूर्य् + अ + आलोक (ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම)

सूर्य् + आ + लोक (සවර්ණෙ දීර්ඝඃ සහ)

सूर्या + लोक

सूर्यालोक (සන්ධිපදය)

## පියවර 2

- 2 ශ්‍රේණියේ පෙළපොතේ 19 වන පාඩම යොදා ගනිමින් සංස්කෘත භාෂාවෙහි ස්වරසන්ධි, ව්‍යඤ්ජනසන්ධි, අනුස්වාරසන්ධි, විසර්ගසන්ධි සහ ප්‍රකෘතිභාවසන්ධි නමින් ප්‍රභේද පහක් ඇති බව සඳහන් කරන්න.
- සංස්කෘත සන්ධි වර්ග පහ වෙන වෙන ම හඳුනා ගැනීමට මග පෙන්වන්න. (ඇමුණුම 2)
- ඇමුණුම 3 යොදා ගනිමින් සන්ධිපද හා විසන්ධිපද හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

## පියවර 3

- සංස්කෘත පාඨමාලා 2 වන ග්‍රන්ථය යොදා ගනිමින් නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨවල සඳහන් ඕනෑ ම සන්ධි වර්ගයකට අයත් සන්ධිපද පහක් උපුටා දැක්වීමට සිසුන් යොමු කරන්න.
- උපුටා ගත් සන්ධිපද විසන්ධි කිරීමට සිසුන් මෙහෙයවන්න.
- සන්ධි ප්‍රභේද යටතේ එම සන්ධිපද වෙන් කිරීමට උපදෙස් දෙන්න.

## මූලික වදන් සංකල්පය :

- පූර්වාපරවර්ණයොඃ සන්ධානඃ සන්ධිඃ

(පූර්ව අපර වර්ණයන් මැනැවින් ගැළපීම සන්ධි නම් වේ.) (සාරස්වතය)

පෙරපර වණන් නිසිවිදිනි ගළපනු සඳ නම් (සිදත්සඟරාව)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සන්ධි යනු කුමක්දැයි උදාහරණ ඇසුරෙන් නිවැරදි ව පැහැදිලි කිරීම
- සාමාන්‍ය කථා ව්‍යවහාරයේ දී සන්ධිපද භාවිත වන බවට නිදසුන් ඉදිරිපත් කිරීම
- සංස්කෘත සන්ධි වර්ග පහ නිවැරදි ව නම් කිරීම
- දෙන ලද නිර්දිෂ්ට ගද්‍යපද්‍ය කොටස්හි ඇතුළත් සන්ධිපද උපුටා දැක්වීම
- විසන්ධි පද, සන්ධි කිරීම සහ සන්ධිපද විසන්ධි කිරීම
- නියමිත සන්ධිපද ප්‍රභේද අනුව වර්ග කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය පෙළපොත
- ඇමුණුම - 1,2 සහ 3
- ඇමුණුම - 3 පරිදි සකසා ගත් කාඩ්පත්
- සංස්කෘත පාඨමාලා 2 වන ශ්‍රේණිය

ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනය සඳහා :

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි
- සාරස්වතව්‍යාකරණම් (දේවනාගරී) ප්‍රාචී අධ්‍යාපන ආයතනය

ගුරුවරයාගේ අවධානයට :

සිසුන්ට ඉගැන්වීමේ දී පෙළ පොතේ සහ සංස්කෘත පාඨමාලා 2 ග්‍රන්ථයේ ඇති සන්ධි පද ම යොදා ගන්න.

## ඇමුණුම 1

භාෂාවෙහි සුබෝච්චාරණය, ශ්‍රවණ මාධූර්යය හා බස හැසිරවීමේ පහසුව සඳහා සන්ධිපද උපයෝගී කරගනී. සන්ධි යනු පූර්වාපර වර්ණයන් දෙකක් නිසි අයුරින් ගැළපීමයි. (**පූර්වාපරවර්ණයොඃ සන්ධානඃ සන්ධිඃ**) සාමාන්‍ය කථා ව්‍යවහාරයෙහි එවැනි සන්ධිපද බොහොමයක් දැකිය හැකි ය. පහත සඳහන් ආදර්ශ වාක්‍ය මගින් එය තහවුරු කර ගත හැකි ය.

**වැල්ලල වැලට වතුර දැමූ, අනතුරුව රුක්කත්තන ගහ ළඟ වැටී තිබුණු පොල්ලත්ත ගංඉවුරේ බඳින්නට ගොස් ලිස්සා වැටීමෙන් අම්මාගේ දකුණත හා වමත තුවාල විය.**

මෙහි ඇති වැල්ලල, රුක්කත්තන, පොල්ලත්ත, ගංඉවුර, දකුණත, වමත යන පද සන්ධිපදයි. ඒවා වැල් + අල, රුක් + අත්තන, පොල් + අත්ත, ගඟ + ඉවුර, දකුණු + අත, වම් + අත යනුවෙන් භාෂාවෙහි යෙදිය යුතු වුව ද සුබෝච්චාරණය, භාෂාවේ මාධූර්ය හා ඉක්මනින් භාෂාව හැසිරවීම සඳහා නිරායාසයෙන් සන්ධි වී ඇති බව තහවුරු වෙයි. එවැනි පද රාශියක් ව්‍යවහාර කරන මාතෘභාෂාවෙහි නිරන්තරයෙන් භාවිත වේ.

ලිග්ගල, ලිප් + ගල / වක්කඩ, වප් + කඩ / ගුරුතුමා, ගුරු + උතුමා / ඈත, ඒ + අත / මෑත, මේ + අත / රජතුමා, රජ + උතුමා / කම්මල, කම් + හල / අස්සන, අත් + සන වැනි සන්ධිපද කිහිපයක් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## ඇමුණුම 2

**ස්වරසන්ධියක් හඳුනාගැනීම** -

සන්ධි වන පදයෙහි පෙරපදයේ අග ස්වරයක් ද පසු පදයේ මුල ද ස්වරයක් ඇත්නම් එය ස්වර සන්ධියකි.

**न** + **अहं** > **नाहं**

**ව්‍යඤ්ජනසන්ධියක් හඳුනාගැනීම** -

සන්ධි වන පද දෙකෙහි මුල්පදයේ අග ව්‍යඤ්ජනයක් හා පසුපදයේ මුල් අක්ෂරය ලෙස ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් ඇත්නම් එය ව්‍යඤ්ජන සන්ධියකි.

**वाग्** + **ईशः** > **वागीशः**

**අනුස්වාරසන්ධියක් හඳුනා ගැනීම** -

අනුස්වාරය හෙවත් බින්දුව මුල් වී සෑදෙන සන්ධිය අනුස්වාරය යි.

**किं** + **इदं** > **किमिदं**

**විසර්ගසන්ධිපදයක් හඳුනාගැනීම** -

විසර්ගය මුල් වී සෑදෙන සන්ධිය විසර්ග සන්ධිය යි.

**सः + गच्छति > स गच्छति**

**ප්‍රකෘතිභාව සන්ධිපදයක් හඳුනාගැනීම** -

ස්වර, ව්‍යඤ්ජන ආදි ඉහත කී සන්ධිවල දී මෙන් ලෝප - ආදේශ ආදි ක්‍රමවලින් සන්ධි නොවන සන්ධි විශේෂ ප්‍රකෘතිභාව සන්ධි නම් වේ. සන්ධි, විසන්ධිපද දෙකේ දී ම එක ම අයුරින් වචනය පිහිටීම හෙවත් ස්වභාවයෙන් ම සන්ධි වී පැවතීම ප්‍රකෘතිභාව සන්ධියේ විශේෂ ලක්ෂණය වේ.

උදා:- **अग्नि + अत्र = अग्नि अत्र**
**हे + बुद्ध = हे बुद्ध**
**अहो + ईश्वर = अहो ईश्वर**

**ඇමුණුම 3**

සන්ධිපද දහයක් හා ඒවායෙහි විසන්ධිපද කාඩ්පත්වල ලියන්න. ඒවා වෙන් වෙන් වූ භාජන දෙකකට දමන්න. පන්තියෙහි සිටින සිසුන් සමාන කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක සිසුන් පෙන්වන සන්ධි හෝ විසන්ධිපදයට අනුරූප සන්ධි හෝ විසන්ධිපදය අනෙක් කණ්ඩායමට පෙන්වීමට අවස්ථාව සලසා දෙන්න.

එම ක්‍රියාකාරකම තුළින් ම අදාළ සන්ධිපදය අයත් සන්ධි ප්‍රභේදය හඳුනාගැනීමට ශිෂ්‍යයන් පොළඹවන්න.

| | |
|---|---|
| **चन्द्र + आलोकः = चन्द्रालोकः** | **देव + आलयः = देवालयः** |
| **हित + उपदेशः = हितोपदेशः** | **नै + अकः = नायकः** |
| **वाक् + अर्थः = वागर्थः** | **दिक् + गजः = दिग्गजः** |
| **किं + अपि = किमपि** | **जलं + आदाय = जलमादाय** |
| **मनः + रथः = मनोरथः** | **देवदत्त + एहि = देवदत्त एहि** |
| **अहो + ईश्वरः = अहो ईश्वरः** | **पुनः + भवः = पुनर्भवः** |
| **सत् + धर्मः = सद्धर्मः** | **कः + गच्छति = को गच्छति** |

# පාඩම 5 - වාක්‍යනිර්මාණය - i

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 උක්තය, ආඛ්‍යාතය, කර්මය සහ නාම විශේෂණ ඇති සරල වාක්‍ය ගොඩනගයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- උක්තය සහ ආඛ්‍යාතය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.
- උක්තය සහ ආඛ්‍යාතය ඇති සරල වාක්‍ය දීර්ඝ කරමින් කර්මය සහ නාමවිශේෂණ යොදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- ඇමුණුම 1 හි පරිදි උක්තපද හා ආඛ්‍යාතපද වෙන වෙන ම දැක්වෙන කාඩ්පත් සිසුන්ට සපයන්න.
- එහි උක්තපදයට ගැළපෙන ආඛ්‍යාතපදය ඇති සිසුන් දෙදෙනා එක් වී උක්තාඛ්‍යාත සහිත සරල වාක්‍යයක් ගොඩනගන ලෙස උපදෙස් දෙන්න.
- සුදුසු කර්ම හෝ නාමවිශේෂණ යොදමින් මෙම වාක්‍ය දීර්ඝ කිරීමට හැකි සිසුන්ට ඊට අවස්ථාව දී සාකච්ඡාවක් මෙහෙය වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 2 සිසුන්ට ලබා දෙන්න.
- එහි ඇති වර්තමාන කාල වාක්‍ය ගුරුභවතා කියවූ විට ඊට අදාළ අතීත හා අනාගත කාල වාක්‍ය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මේ අනුව සරල වාක්‍යයක් කාලත්‍රය ඔස්සේ ගොඩනැගීම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.

## පියවර 2

- ඇමුණුම 3 හි ඇති ශ්ලෝකය සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- එම ශ්ලෝකයේ සරල අදහස පහදා දෙන්න.
- එම ශ්ලෝකයේ අන්තර්ගත උක්තාඛ්‍යාතපද උපුටා දක්වමින් සරල වාක්‍ය හතරක් නිර්මාණය වී ඇති බව පෙන්වා දෙන්න.
- ශ්ලෝකයේ අන්තර්ගත සරල වාක්‍යවලට සමාන වාක්‍ය කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒවා හුණු පුවරුවේ ලියා උක්තය හා ආඛ්‍යාතය වෙන් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

## පියවර 3

- කිසියම් උක්තයකට කාලත්‍රය අනුව ආඛ්‍යාතය ද වෙනස් කර යෙදිය හැකි බව පැහැදිලි කරන්න.
- ආඛ්‍යාතය වෙනස් කිරීමෙන් අතීතකාල හා අනාගත කාල වාක්‍ය නිර්මාණය කළ හැකි බව වටහා දෙන්න.
- **तत्**, **अस्मद्**, **युष्मद्** ශබ්දවල ප්‍රථමාවිභක්ති රූප පෙන්වා දෙන්න.
- **तत्** ශබ්දයේ ප්‍රථමාරූප උක්ත වන විට ප්‍රථමපුරුෂ ආඛ්‍යාතපද ද, **युष्मद्** ශබ්දයේ ප්‍රථමාරූප උක්ත වන විට මධ්‍යමපුරුෂ ආඛ්‍යාතය ද, **अस्मद्** ශබ්දයේ ප්‍රථමාරූප උක්ත වන විට උත්තමපුරුෂ ආඛ්‍යාතය ද යෙදෙන බව පැහැදිලි කරන්න.

## පියවර 4

- පෙළපොතේ සංස්කෘත භාෂාව දෙවන වසර 06 සිට 09 පාඩම් කෙරෙහි අවධානය යොමු කරමින් උක්තය සඳහා භාවිත කරන නාමපදයට විශේෂණ එකතු කරගත හැකි බව පෙන්වා දෙන්න.
- උක්තාඛ්‍යාත අතරට කර්මයක් යොදා වාක්‍ය දීර්ඝ කර ගත හැකි බව වටහා දෙන්න.
- බාලාදර්ශයේ 1 සිට 15 පාඩම් යොදා ගනිමින් තව දුරටත් වාක්‍ය දීර්ඝ කිරීම පිළිබඳ අභ්‍යාස කරවන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- වර්තමාන කාල සරල සංස්කෘත වාක්‍යයක් අතීතයට හා අනාගතයට හරවා ප්‍රකාශ කිරීම/ දේවනාගරී අකුරෙන් ලිවීම
- ඒකවචන වාක්‍ය කිහිපයක් ද්විවචනයට හා බහුවචනයට හරවා ලිවීම
- **अस्मद्** හා **युष्मद्** ශබ්දවල ප්‍රථමාරූප (උක්තපද) හා ඊට ගැළපෙන කාලත්‍රයෙහි වරනගන ලද ආඛ්‍යාත යොදා නිවැරදි ව වාක්‍ය නිර්මාණය කිරීම
- නාමවිශේෂණ සහ කර්මපද යොදා වාක්‍ය දීර්ඝ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- එළිමහන් පිරිවෙන් පරිශ්‍රය
- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය, පෙළ පොත
- ඇමුණුම 01, 02 හා 03
- බාලාදර්ශය 1 සිට 15 දක්වා පාඩම්

ඇමුණුම 1

**පන්තියේ සිසුන් සංඛ්‍යාවට සරිලන සේ සැකැසූ කාඩ්පත්**

| | |
|---|---|
| रथकारः | तुष्यति |
| गुरुः | उपदिशति |
| भिक्षुः | नमति |
| शकुनाः | कूजन्ति |
| बन्धवः | उपविशन्ति |
| कवयः | गायन्ति |
| सचिवौ | ताडयतः |
| सारथी | हरतः |
| साधू | देशयतः |
| त्वं | धावसि |
| युवां | जयथः |
| यूयं | वपथ |
| अहं | आहरामि |

ඇමුණුම 2

වර්තමානකාල, අතීතකාල සහ අනාගතකාල වාක්‍ය

| | | |
|---|---|---|
| बालकः वदति । | बालकः अवदत् । | बालकः वदिष्यति । |
| शिशू नमथः । | शिशू अनमताम् । | शिशू नंस्यतः । |
| बन्धवः गच्छन्ति । | बन्धवः अगच्छन् । | बन्धवः गमिष्यन्ति । |
| त्वं जयसि । | त्वम् अजयः । | त्वं जेष्यसि । |
| युवां पश्यथः । | युवाम् अपश्यतम् । | युवां द्रक्ष्यथः । |
| यूयं कथयथ । | यूयम् अकथयत । | यूयं कथयिष्यथ । |
| अहं पिबामि । | अहम् अपिबम् । | अहं पास्यामि । |
| आवां पठावः । | आवाम् अपठाव । | आवां पठिष्यावः । |
| वयं गायामः । | आवाम् अगायाम । | वयं गास्यामः । |

ඇමුණුම 3

धर्मो जयति नाधर्मः सत्यं जयति नानृतम् ।
क्षमा जयति न क्रोधो देवो जयति नासुरः ॥

# පාඩම 6 - වාක්‍යනිර්මාණය - ii

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 පුරුෂ භේදය සහ වචන භේදය සැලකිල්ලට ගනිමින් සරල වාක්‍ය ගොඩනගයි.

**කාලච්ඡේද** : 18 යි.

**ඉගෙනුම් පල** :

- ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ, මධ්‍යමපුරුෂ, සහ උත්තමපුරුෂ ලෙස වෙන් කරයි.
- ප්‍රථමපුරුෂ හෝ මධ්‍යමපුරුෂ හෝ උත්තමපුරුෂ හෝ ආඛ්‍යාතය සහිත නිවැරදි සරල වාක්‍ය ගොඩනගයි.
- දෙනු ලබන වාක්‍යවල ආඛ්‍යාතය ඒකවචන, ද්විවචන, බහුවචන ලෙස වර්ග කර දක්වයි.
- ඒකවචන, ද්විවචන, බහුවචන ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 හි දැක්වෙන පිටු පෙරළනයේ පිටුව 1 ප්‍රදර්ශනය කරන්න.
- එහි අඩංගු **वद्, पठ्, पच्, नम्, धाव्** යන ධාතුවල වර්තමානකාල පරස්මෛපද ප්‍රථමපුරුෂයේ පමණක් සම්පූර්ණයෙන් වරනගන ලද වගුව ප්‍රදර්ශනය කර සිසුන් ලවා කියවන්න.
- පිටුව 2 හි පරිදි ඉහත ධාතුවලට වර්තමානකාල පරස්මෛපද මධ්‍යමපුරුෂයේ පමණක් සම්පූර්ණයෙන් වරනගන ලද වගුව ප්‍රදර්ශනය කර සිසුන් ලවා කියවන්න.
- පිටුව 3 හි පරිදි එම ධාතුවල ම වර්තමානකාල පරස්මෛපද උත්තමපුරුෂයේ පමණක් සම්පූර්ණයෙන් වරනගන ලද වගුව ප්‍රදර්ශනය කර සිසුන් ලවා කියවන්න.
- පන්තියේ සිසුන් කොටස් තුනකට බෙදා එක් කණ්ඩායමක් ඒකවචන වාක්‍යයක් කියූ විට අනිත් කණ්ඩායම් දෙකට පිළිවෙළින් ඊට අදාළ ද්විවචන හා බහුවචන වාක්‍යය ගොඩනැඟීමට උපදෙස් දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- දෙවන ශ්‍රේණිය සංස්කෘත භාෂාව පෙළ පොතේ 10 සිට 18 දක්වා සහ බාලාදර්ශයේ 1 සිට 15 දක්වා පාඩම් කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- සෑම ආඛ්‍යාතයක් ම පුරුෂත්‍රයට, වචනත්‍රයට හා කාලත්‍රයට අයත්වන බව පෙන්වන්න.
- ඒවාට නිදසුන් සැපයීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පුරුෂත්‍රයට, වචනත්‍රයට හා කාලත්‍රයට අදාළ ආඛ්‍යාත ඇති සරල වාක්‍ය ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න.
- ඒවායේ ආඛ්‍යාතය ඒ ඒ පුරුෂ යටතේ වගුගත කරවන්න.
- එම වාක්‍යවල ආඛ්‍යාතය ඒ ඒ වචන යටතේ වගුගත කරවන්න.
- එම වාක්‍යවල ආඛ්‍යාතය කාලත්‍රය යටතේ වගුගත කරවන්න.
- පුරුෂත්‍රයට අදාළ ආඛ්‍යාතය සහිත ව සරල වාක්‍ය නිර්මාණය කරවන්න.
- වචනත්‍රයට අදාළ ආඛ්‍යාතය සහිත ව සරල වාක්‍ය නිර්මාණය කරවන්න.
- කාලත්‍රයට අදාළ ආඛ්‍යාතය සහිත ව සරල වාක්‍ය නිර්මාණය කරවන්න.
- ඉහත වාක්‍ය දේවනාගරී අකුරෙන් ලියවන්න.
- පන්තිය කොටස් තුනකට බෙදා තරගයක ස්වරූපයෙන් පුරුෂත්‍රයට, වචනත්‍රයට හා කාලත්‍රයට අදාළ ආඛ්‍යාත ඇති වාක්‍ය විමසා වාක්‍ය නිර්මාණයට මග පෙන්වන්න. (නිද - එක් කණ්ඩායමක් ප්‍රථමපුරුෂ වාක්‍යයක් ප්‍රකාශ කළ විට අනිත් කණ්ඩායම් දෙක පිළිවෙළින් එම වාක්‍ය මධ්‍යම හා උත්තමපුරුෂ වාක්‍ය බවට පෙරළීම)

**පියවර 2**

- කරණාර්ථය හා සහාදි යෝගය සහිත සරල වාක්‍ය සාකච්ඡා කරමින් පහදා දෙන්න.
- වාක්‍ය නිර්මාණයේ දී පිණිසාර්ථය දක්වෙන පද හා නමෝ යෝගය දක්වෙන පද භාවිත වන අයුරු පෙන්වන්න.
- එවැනි වෙනත් වාක්‍ය ගොඩනැංවීමට සිසුන් යොමු කරන්න.
- වෙන්වීම් අර්ථය ප්‍රකට කරන පද පඤ්චමීවිභක්තියෙන් යෙදෙන ආකාරය පහදන්න.
- ඒවා යොදා සරල වාක්‍ය නිර්මාණය සඳහා අභ්‍යාසවල යොදවන්න.
- ඇමුණුම 2හි ඇති ශ්ලෝකය උපුටා දක්වමින් එහි ෂෂ්ඨීවිභක්තිපදවල අර්ථය මතු කර පෙන්වන්න.
- ෂෂ්ඨීවිභක්තිපද යොදා සරල වාක්‍ය නිර්මාණයට සිසුන් යොමු කරන්න.

- ආධාරාර්ථයේ පද වාක්‍ය නිර්මාණයට අවශ්‍ය බවත් සප්තමීවිභක්ති පදවලින් එම අවශ්‍යතාව ඉටුකර ගත හැකි බවත් පැහැදිලි කරන්න.
- එම විභක්තිපද යෙදුණු වාක්‍යයන් අවබෝධ කරවීමට පරිවර්තන කාර්යයෙහි යොදවන්න.
- ඇමුණුම 3 යොදා ගනිමින් සරල වාක්‍ය සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමටත්, මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට නගා දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලිවීමටත්, සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- පුරුෂත්‍රය
- වචනත්‍රය
- කාලත්‍රය
- මූලික විභක්ත්‍යර්ථ
- අව්‍යයපද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සහාදි යෝගය හා නමෝ යෝගය යෙදෙන විභක්ති නම් කිරීම
- දෙන ලද වාක්‍ය කිහිපයක ආඛ්‍යාතය පුරුෂත්‍රය, වචනත්‍රය හා කාලත්‍රය යටතේ වගුගත කිරීම
- පුරුෂත්‍රය, වචනත්‍රය හා කාලත්‍රයට අදාළ ආඛ්‍යාත යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- මූලික විභක්ත්‍යර්ථ මතු කරන සරල වාක්‍ය පරිවර්තනය කිරීම
- අව්‍යයපද එකතු කරමින් වාක්‍ය නිර්මාණය

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 (පිටු පෙරළනය), ඇමුණුම 2 සහ 3
- සංස්කෘත භාෂාව - දෙවන ශ්‍රේණිය, පෙළපොත
- බාලාදර්ශයේ 1 සිට 15 පාඩම්

ඇමුණුම 1

වර්තමානකාල පරස්මෛපද ප්‍රථමපුරුෂයේ වරනැගීම

| ධාතුව | ඒකවචන | ද්විවචන | බහුවචන |
| --- | --- | --- | --- |
| वद् | वदति | वदतः | वदन्ति |
| पच् | पचति | पचतः | पचन्ति |
| पठ् | पठति | पठतः | पठन्ति |
| नम् | नमति | नमतः | नमन्ति |
| धाव् | धावति | धावतः | धावन्ति |

වර්තමානකාල පරස්මෛපද මධ්‍යමපුරුෂයේ වරනැගීම

| ධාතුව | ඒකවචන | ද්විවචන | බහුවචන |
| --- | --- | --- | --- |
| वद् | वदसि | वदथः | वदथ |
| पच् | पचसि | पचथः | पचथ |
| पठ | पठसि | पठथः | पठथ |
| नम् | नमसि | नमथः | नमथ |
| धाव् | धावसि | धावथः | धावथ |

වර්තමානකාල පරස්මෛපද උත්තමපුරුෂයේ වරනැගීම

| ධාතුව | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| वद् | वदामि | वदावः | वदामः |
| पच् | पचामि | पचावः | पचामः |
| पठ् | पठामि | पठावः | पठामः |
| नम् | नमामि | नमावः | नमामः |
| धाव् | धावामि | धावावः | धावामः |

ඇමුණුම 2

अलसस्य कुतः शिल्पम् - अशिल्पस्य कुतो नृपः।
अधनस्य कुतो मित्रम् - अमित्रस्य कुतः सुखम्॥

පහත සඳහන් වාක්‍ය සිංහලයට නගන්න.

१. कर्षकः खनित्रेण खनति ।

२. अहं नेत्राभ्यां चित्रं पश्यामि ।

३. उपासकाः पुष्पेभ्यः बुद्धं पूजयन्ति ।

४. बालिका पुष्पाय उद्यानं गच्छति ।

५. गुरुः शिष्याय त्यागं वितरति ।

६. चोरौ धनम् अचोरयताम् ।

७. अम्बा ओदनम् अपचत् ।

८. त्वं कथाम् अकथयः ।

९. कपयः तरोः अवरोहन्ति ।

१०. मूषिकः बिलात् निष्क्रामति ।

११. नायकस्य भार्या अतिथिभ्यः आहारम् अयच्छत् ।

१२. विहगाः तरुषु नीडानि कुर्वन्ति ।

१३. बालकस्य हस्तयोः फलानि सन्ति ।

१४. एकः शृगालः वनं गच्छति ।

१५. वने एका अजा अस्ति ।

१६. अजाः शृगालेन सह गच्छन्ति ।

१७. तस्मिन् क्षणे अजा तत्र आगच्छति ।

१८. शिशुः मातुः समीपं धावति ।

१९. अहं वने एव वसामि ।

२०. अहं शशकस्य आखेटाय भ्रमामि ।

**පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.**

1. මව්වරු කළවලින් ජලය ගෙන එති.

2. අපි මිතුරන් සමග පාසලට යමු.

3. පියා පුතුට රසකැවිලි දෙයි.

4. අයියා මල්ලීට තෑග්ගක් දෙයි.

5. අපි දෙදෙන ගී ගැයුවෙමු.

6. ළමයි බුදුන් වැන්දහ.

7. කුරුල්ලෝ කූඩුවලින් නික්මෙති.

8. නැවියෝ නැවෙන් ගොඩබසිති.

9. ගොවියාගේ පුතා කුඹුරට ගියේ ය.

10. ධනවතාගේ බිරිඳ කඩයට ගියා ය.

11. ඇත්තු වනයෙහි සැරිසරත්.

12. ධනවත්තු නගරවල වාසය කරති.

# පාඩම 7 - නිර්දිෂ්ටග්‍රන්ථ - නාමාෂ්ටශතකය

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 නිර්දිෂ්ටග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.
- නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 දේවනාගරී අක්ෂරවලින් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- නාමාෂ්ටශතකයෙන් තෝරා ගත් ශ්ලෝක දෙකක් ලියන ලද පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- මිහිරි ලෙස ගායනය කිරීමේ හැකියාව ඇති සිසුන් දෙදෙනකු ලවා එම ශ්ලෝක සජ්ඣායනා කරවන්න.
- එම ශ්ලෝක බුදුරජාණන් වහන්සේගේ විශේෂ ගුණයන් සඳහා යොදා ඇති නාම බව පවසන්න.
- එබඳු නාම 108 ක් නාමාෂ්ටශතකයෙහි ඇතුළත් බව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- නාමාෂ්ටශතකයේ ශ්ලෝක 18 සිසුන්ගේ අවධානයට යොමු කරන්න.
- බැඳි අකුරු හා මහාප්‍රාණ අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් ශ්ලෝක හඬනගා කියවන්න.
- එම ශ්ලෝක කිහිප වතාවක් සිසුන් සමග සාමූහික ව හඬනගා කියවා නිවැරදි උච්චාරණයට හුරු කරවන්න.
- ඒවා සජ්ඣායනා කර පෙන්වන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා තරගයක් ආකාරයෙන් වෙන් වෙන් ව ශ්ලෝක සජ්ඣායනයට ඉඩ සලස්වන්න.
- සිසුන්ට කේවල වශයෙන් සජ්ඣායනා කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- එම ශ්ලෝක සජ්ඣායනා කරමින් වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- ශ්ලෝක 18 සිසුන්ගේ අභ්‍යාස පොතෙහි දේවනාගරී අකුරෙන් ලිවීමට යොමු කරන්න.
- ඇමුණුම 1 හා 2 හි ආකෘතියට අනුව ශ්ලෝක 18 මතකයෙන් ලිවීමට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- නාමාෂ්ටශතකය (බුදුරජාණන් වහන්සේගේ ගුණ ප්‍රකාශවන නාම 108)
- නාම + අෂ්ට + ශතකය

  නාම ↓ නම්　　අෂ්ට + ශතකය → 108

- කේවල වශයෙන් = තනි තනි ව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාමාෂ්ටශතකයේ ශ්ලෝක 18 කටපාඩමින් සජ්ඣායනා කිරීම
- ශ්ලෝකවල මහාප්‍රාණ සහ බැඳි අකුරු නිවැරදි ව උච්චාරණය කිරීම
- සංයුක්තාක්ෂර දේවනාගරී අක්ෂරවලින් ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්ලෝක දෙකක් ලියන ලද පුවරුව
- ගායන හැකියාව ඇති සිසුන්
- නාමාෂ්ටශතකය
- ඇමුණුම 1 සහ 2

**ගුරුවරයාගේ අවධානයට :**

- නාමාෂ්ටශතකයේ අර්ථය ප්‍රකාශ කිරීම අපේක්ෂා නොකෙරේ.

**ඇමුණුම 1**

- හිස්තැන් සහිත ව දෙනු ලබන ශ්ලෝක මාතෘභාෂාවෙන් සහ දේවනාගරී අක්ෂරවලින් සම්පූර්ණ කිරීම

- පහත සඳහන් ශ්ලෝක සම්පූර්ණ කරන්න.

නිදසුනක් පමණයි. 01. සම්බුද්ධං පුණ්ඩරීකාක්ෂං

.........................................................

සමන්තභද්‍රං ශාස්තාරං

.........................................................

02. දෙවදෙවං මහාදෙවං

.........................................................

ප්‍රමාණාතීත දෙවෙශං

.........................................................

**ඇමුණුම 2**

- පහත සඳහන් ශ්ලෝක දේවනාගරී අකුරෙන් ලියන්න.

නිදසුනක් පමණයි. 01. ශ්‍රීඝනං ශ්‍රීමතිං ශ්‍රේෂ්ඨං

ශීලරාශිං ශිවඞ්කරම්

ශ්‍රීමන්තං ශ්‍රීකරං ශාන්තං

ශාන්තවෙශං නමාම්‍යහම්.

02. පරමාර්ථං පරජ්‍යෝතිං

පරමං පරමෙශ්වරම්

භවාභවකරං භව්‍යං

භගවන්තං නමාම්‍යහම්.

# පාඩම 8 - නිර්දිෂ්ටග්‍රන්ථ - ව්‍යාසකාරය

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 නිර්දිෂ්ටග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** : 6.2

- ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝක නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.
- ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.
- ව්‍යාසකාරයේ 01 සිට 30 දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සජ්ඣායනා කරන ශ්ලෝක කිහිපයක් හඬපටයක් හෝ තාක්ෂණ මාධ්‍ය මගින් සිසුන්ට ශ්‍රවණය කරන්නට සලස්වන්න.
- එම ශ්ලෝක සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- එබඳු ශ්ලෝක සමූහයක් ඇති ග්‍රන්ථයක් ලෙස ව්‍යාසකාරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- ව්‍යාසකාරයෙහි ඇති ශ්ලෝක ජීවිතාදර්ශ ලෙස යොදගත හැකි බව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක අඩංගු ග්‍රන්ථය සිසුන්ගේ අවධානයට ලක්කරන්න.
- එම ශ්ලෝක මහාප්‍රාණ හා සංයුක්තාක්ෂර නිවැරදි ව උච්චාරණය වන ලෙස හඬනගා සජ්ඣායනා කරන්න.
- සිසුන් සමග සාමූහික ව ද සජ්ඣායනා කරමින් නිවැරදි උච්චාරණයට හුරු කරවන්න.
- එක් එක් ශිෂ්‍යයාට ද තනි තනි ව සජ්ඣායනා කිරීමට ඉඩ ලබා දෙන්න.
- එම ශ්ලෝක නිවැරදි ව සජ්ඣායනා කරමින් ඒවා වාචෝද්ගත කිරීමට සිසුන් යොමු කරන්න.
- වාචෝද්ගත කළ ශ්ලෝක දේවනාගරී අකුරෙන් ලිවීමට උපදෙස් දෙන්න.
- ඒ ඒ ශ්ලෝකයන්හි අර්ථය පැහැදිලි කර දෙන්න.
- ශ්ලෝකාර්ථ ද වාචෝද්ගත කරන ලෙස උපදෙස් දෙන්න.

- ඇමුණුම 1 හා 2 හි සඳහන් පරිදි වාචෝද්ගත කළ ශ්ලෝක මව්බසෙන් සහ දේවනාගරී අකුරෙන් ලිවීමට අවස්ථාව දෙන්න.
- ශ්ලෝක 30 කුසපත් ඇදීමෙන් සිසුන්ට පවරා ඒ ඒ ශ්ලෝකයේ ආදර්ශයෙන් පුද්ගල සංවර්ධනය ඇති කර ගත හැකි ආකාරය දක්වමින් මිනිත්තු 02 ක ක්ෂණික කථාවක් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්පය :**

- ව්‍යාසකාරය (ව්‍යාස නම් ඍෂීන් විසින් කරන ලද කෘතියක් බැවින් ව්‍යාසකාරය නම් වේ.)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ව්‍යාසකාරයේ ශ්ලෝක කට පාඩමින් සජ්ඣායනා කිරීම
- එම ශ්ලෝකවල අර්ථ පැහැදිලි කිරීම
- ගුරුවරයා කිසියම් ජීවිතාදර්ශයක් ගෙන හැර දක්වූ විට ඊට අදාළ ශ්ලෝකය ඉදිරිපත් කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ව්‍යාසකාරයේ ශ්ලෝක ඇතුළත් හඬපටය / තාක්ෂණික මාධ්‍ය සහ ශබ්දවිකාශන යන්ත්‍රය
- ව්‍යාසකාරයේ 1 සිට 30 දක්වා ශ්ලෝක අඩංගු ග්‍රන්ථය
- ශ්ලෝක පාද ලියන ලද කාඩ්බෝඩ් තීරු
- ඇමුණුම 1 සහ 2
- ශ්ලෝක 30 ඇතුළත් කුසපත් 30 ක්

**ඇමුණුම 1**

- තැන තැන විසුරුවා ඇති ශ්ලෝක පාද ලියන ලද කාඩ්බෝඩ් තීරු නිවැරදි ව එක්කොට ශ්ලෝකයක් සම්පූර්ණ කරන්න.
- එහි අර්ථය පැහැදිලි කරන්න. (නිදසුනක් පමණයි.)

**ඇමුණුම 2**

- පහත සඳහන් ශ්ලෝකය සම්පූර්ණ කොට දේවනාගරී අකුරෙන් ලියන්න. (නිදසුනක් පමණයි.)

අඥානතිමිරාන්ධානාං

.........................................................

ඥානාඤ්ජනශලාකාභිර්

.........................................................

# පාඩම 9 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත නාමවරනැගිල්ල

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 නිර්දිෂ්ටග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 11 යි.

**ඉගෙනුම් පල** : 6.3

- 'සංස්කෘත වරනැගිල්ල' යොදා ගනිමින් කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද වාචෝද්ගත ව වරනගයි.
- කවි, සාධු, පුෂ්ප, පිතෘ සහ වනිතා යන ශබ්ද හා සමාන අන්ත ඇති අනෙකුත් නාම වරනැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- නාම වරනැගීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන්න.
- එයින් එක් ශබ්දයක් වරනගා පෙන්වන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙද නාම වරනැගීම් වගු ලබා දෙන්න.
- සිසුන් සමග සියලු ශබ්ද ක්‍රමානුකූල ව වරනගන්න.
- ඇමුණුම 1 යොද ගනිමින් නාම වරනැගීම පිළිබඳ සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පෙළපොතෙහි ඇති කවි, සාධු, පුෂ්ප, පිතෘ හා වනිතා යන ශබ්ද ඇතුළත් නාමවරනැගීම් සහිත වගුවවෙත සිසු අවධානය යොමු කරන්න.
- වගුවල ඇති එක් එක් නාමය සිසුන් සමග සාමූහික ව වරනගන්න.
- වගුවේ ඇති එක් ශබ්දයක් තනි තනි ව වරනගන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- අන්ත, විභක්ති, වචන හා ලිඞ්ග වශයෙන් ඉහත ශබ්දවල ඇති විශේෂතා පෙන්වා දෙන්න.
- එම නාම වරනැගීම් වාචෝද්ගත කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- වරනැගීම් වගුව ඇසුරු කරමින් ඒ හා සමාන අන්ත හා ලිඞ්ග ඇති නාම ඉදිරිපත් කරන්න.
- එම නාම ද වරනැගීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- විභක්තිවල අර්ථ පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- විභක්ත්‍යර්ථ ද වාචෝද්ගත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- ඇමුණුම 2 හි සඳහන් පරිදි නාමවරනැගීම්වල හිස්තැන් පිරවීමට අවස්ථාව දෙන්න.
- එම වරනැගීම්වල ඇති කිසියම් වචනයක් ඉදිරිපත් කරමින් ඊට අදාළ විභක්තිය, වචනය, අර්ථය හා ලිඞ්ගය ක්ෂණික ව ප්‍රකාශ කිරීමට සිසුන්ට කේවල වශයෙන් අවස්ථාව දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අන්ත වශයෙන් හා ලිඞ්ග වශයෙන් වෙනස් නාම ඒ ඒ විභක්ති ඔස්සේ මතකයෙන් වරනගා පෙන්වීම
- විභක්ති, වචන හා ලිඞ්ග නිවැරදි ව භාවිත කිරීම
- අන්ත වශයෙන් සමාන නාම ප්‍රකාශ කිරීම හා ලියා දක්වීම
- විභක්ත්‍යර්ථ විස්තර කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, ඍකාරාන්ත නාමවරනැගීම් 01 බැගින් ඇතුළත් පුවරුවක්
- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත නාමවරනැගිල්ල

**ඇමුණුම 1**

- විභක්ති මගින් සිදු කෙරෙන්නේ යම් නාමයකට විවිධාර්ථ ගැන්වීම යි. නාමයක් නාමපදයක් බවට පත් වන්නේ විභක්ති ගැන්වූ පසු ව යි. (විභක්ත්‍යන්තං පදං) සංස්කෘත භාෂාවේ නාම වරනැගෙන විභක්ති හෙවත් බෙදීම් හතකි. සම්බෝධන හෙවත් ආලපන විභක්තිය ප්‍රථමාවිභක්තියේ ම ප්‍රභේදයක් ලෙස සැලකේ. ඇතැම් තැනක කරණ යනුවෙන් විභක්තියක් දැක්වුව ද එමගින් ප්‍රකාශ වන කරණාර්ථය තෘතීයා විභක්තියෙන් ප්‍රකාශ කෙරේ. යම් නාමයක් ස්වරයක් අන්ත කොට ඇත් නම් ඒ ස්වරාන්ත නාමයකි. ඒවා අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඍකාරාන්ත ආදි වශයෙන් හැඳින්වේ. මෙම සියලු වරනැගීම් ඒකවචන, ද්විවචන හා බහුවචන වශයෙන් වචනත්‍රයකට ද පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග හා නපුංසකලිඞ්ග වශයෙන් ලිඞ්ගත්‍රයකට ද බෙදේ. මෙම නිපුණතාවේ දී ඉකාරාන්ත, උකාරාන්ත හා ඍකාරාන්ත පුංලිඞ්ග නාම, අකාරාන්ත නපුංසකලිඞ්ග නාම සහ ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම වරනැගීම් හා වාචෝද්ගත කිරීම් පිළිබඳ හැකියාව වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

**ඇමුණුම 2**

- පහත සඳහන් ඉකාරාන්ත පුංලිඞ්ග කවි ශබ්දයෙහි හිස්තැන් පුරවන්න. (නිදසුනක්)

| විභක්තයඃ | ඒකවචනම් | ද්විවචනම් | බහුවචනම් |
|---|---|---|---|
| ප්‍රථමා | කවිඃ | | කවයඃ |
| සම්බෝධන | හේ කවී | | |
| ද්විතීයා | කවිම් | | කවීන් |
| තෘතීයා | | කවිභ්‍යාම් | කවිභිඃ |
| චතුර්ථී | | | කවිභ්‍යඃ |
| පඤ්චමී | කවෙඃ | | |
| ෂෂ්ඨී | | කව්‍යොඃ | |
| සප්තමී | | | කවිෂු |

# පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 2

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 නිර්දිෂ්ටග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 23 යි.

**ඉගෙනුම් පල** : 6.4

- සංස්කෘත පාඨමාලා 2 අර්ථාවබොධයෙන් යුතු ව කියවයි.
- නම් කරනු ලබන ව්‍යාකරණාංග සංස්කෘත පාඨමාලා 2 හි ඇතුළත් පාඩම්වලින් උපුටා ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිසුන්ට සංස්කෘත පාඨමාලා 2 පොත ලබා දෙන්න.
- පාඨමාලා 2 පොතෙහි ඇතුළත් ගීතයක් ශ්‍රවණය කරන්නට සලස්වන්න.
- එම ගීතය සිසුන් සමග සාමූහික ව සජ්ඣායනා කරන්න.
- එහි ඇති චිත්තාකර්ෂණීය අංග පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

- වන්දනා ශ්ලෝක සිසුන් සමග සාමූහික ව සජ්ඣායනා කරන්න.
- එහි සරල අදහස විස්තර කරන්න.
- ඒවා අර්ථ සහිත ව වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- සියලු පාඩම්වල ඇති පින්තූර සිසුන්ගේ අවධානයට යොමු කරන්න.
- පාඨමාලා 2 පොතෙහි පාඩම් ශබ්දනගා කියවීමට සිසුන් යොමු කරන්න.
- පාඩම්වල ඇති පින්තූර ඉස්මතු කර පෙන්වමින් පාඩම් සාකච්ඡා කරන්න.
- පාඩම්වල ඇතුළත් ගීත සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- පාඩම්වල අර්ථය පැහැදිලි කරන්න.
- පාඩමෙහි ඇතුළත් දුරවබෝධ පද පහද දී ඒවායේ අර්ථ වාචෝද්ගත කරන ලෙස උපදෙස් දෙන්න.
- අදාළ පාඩම්වල ඇති ව්‍යාකරණාංග පිළිබඳ සිසුන් දැනුම්වත් කර ඇමුණුම 1 හි සිසුන් අභ්‍යාසවල නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සංස්කෘත භාෂා දින/ශිෂ්‍ය සමිතිවල දී පාඨමාලා 2 පොතෙහි අඩංගු ගීත ගායනය හෝ කථා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම
- දේවනාගරී අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් පාඨමාලා 2 පොත කියවීම
- සංස්කෘත ව්‍යාකරණාංග ප්‍රකාශ කිරීම සහ ලිවීම හෝ කථා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම
- දේවනාගරී අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් පාඨමාලා 2 පොත කියවීම
- සංස්කෘත ව්‍යාකරණාංග ප්‍රකාශ කිරීම සහ ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සංස්කෘත පාඨමාලා 2
- කැසට් යන්ත්‍රය හෝ තාක්ෂණික මාධ්‍ය

පහත සඳහන් සිංහල අදහසට ගැළපෙන සංස්කෘත පාඨය තෝරා ඉදිරියෙන් ලියන්න.

अहं भवन्तं न जानामि। नमस्कारः। स्वागतम्। आगच्छतु उपविशतु । कथयतु भवान् किम् इच्छति। अहं किमपि न इच्छामि। एवं न वदतु। कृपया आग्रहं न करोतु। भवान् अत्र वार्तापत्रं पठतु। आस्वादयतु। कथं भोः अपि सर्वं कुशलम्। अद्य भवान् अत्र मध्याह्नभोजनं करोतु।अधुना अहं गन्तव्यम्। बहु विलम्बः जातः। शुभमस्तु। आरोग्यमस्तु। पन्थानः सन्तु ते शिवाः। त्वं कः असि ? त्वं वने किमर्थं भ्रमसि ? त्वं मया सह आगच्छ। मम कार्यं किं भविष्यति। अनुचितकार्याणि न कर्तव्यम्।

i. මම ඔබව නොහඳුනමි.

ii. එන්න වාඩි වෙන්න.

iii. අද ඔබ මෙහෙ දහවල් කෑම ගන්න.

iv. නුසුදුසු ක්‍රියා නොකටයුත්තාහ.

v. ආයුබෝවන්.

vi. මම කිසිවකට කැමති නෑ.

vii. සාදරයෙන් පිළිගන්නවා.

viii. කරුණාකර බලකරන්න එපා.

ix. කියන්න ඔබ මොනවාට ද කැමති?

x. රසවිඳින්න.

xi. එහෙම කියන්න එපා.

xii. දැන් මම යන්න ඕනෙ.

xiii. හුඟක් පරක්කු වුණා.

xiv. ඔබ මෙහි පත්තරය බලන්න.

xv. නිරෝගි වේවා !

xvi. කොහොමද ඉතින් හොඳින් ඉන්නව ද?

xvii. යහපතක් වේවා !

xviii. නුඹේ ගමන සාර්ථක වේවා !

xix. නුඹ මාත් සමග පැමිණෙන්න.

xx. නුඹ කවරෙක් ද?

xxi. මගේ රාජකාරිය කුමක් වන්නෙහි ද?

xxii. කුමක් පිණිස නුඹ කැලයෙහි හැසිරෙහි ද?

01. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

काकः शाखायाम् उपविशति। स दिवा आकाशे डयते, नक्तं नीडे वसति। भेकाः वापीषु वसन्ति। ते वर्षासु रटन्ति। अयं भेकः भूमौ प्लवते। लतासु कुसुमानि विकसन्ति। वयं तरुषु फलानि पश्यामः। समुद्रे रत्नानि जायन्ते। नराः भूमौ वसन्ति। देवाः स्वर्गे तिष्ठन्ति॥

i. කපුටා රාත්‍රි කාලයේ සිටින්නේ කොහේ ද?
ii. **देवाः स्वर्गे तिष्ठन्ति।** යන්නෙහි සිංහල අදහස ලියන්න.
iii. **वयं तरुषु फलानि पश्यामः।** යන වාක්‍යය ඒකවචනයට හරවා ලියන්න.
iv. පොළොවෙහි යන අදහස ඇති සංස්කෘත වචනය ලියන්න.
v. සප්තමීවිභක්තියට අයත් නාමපද හතරක් ලියන්න.

02. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

दुहिता भर्तुः गृहं गच्छति। माता दुहितुः शिशुं लालयति। शिशवः मातॄणां गानेन तुष्यन्ति। पत्नी पत्युः आज्ञाम् अनुसरति। पुत्रः पितुः आज्ञया जामातुः गृहात् स्वसारम् आनयति। वयं शकटस्य शब्दम् आकर्णयामः। यूयं धेनोः क्षीरं पिबथ॥

i. දියණිය කවුරුන්ගේ නිවසට යයි ද?

ii. **वयं शकटस्य शब्दम् आकर्णयामः।** යන්නෙහි සිංහල අදහස ලියන්න.

iii. **शिशवः मातॄणां गानेन तुष्यन्ति।** යන වාක්‍යය ඒකවචනයට හරවා ලියන්න.

iv. නැගණිය යන අදහස ඇති සංස්කෘත වචනය ලියන්න.

v. ෂෂ්ඨීවිභක්තියට අයත් නාමපද හතරක් ලියන්න.

03. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

नक्षत्राणि कदा प्रकाशन्ते। नक्षत्राणि रात्रौ प्रकाशन्ते। तानि दिवा न प्रकाशन्ते। मेघैः आवृते नभसि रात्रौ च न प्रकाशन्ते। यदा सूर्यः अस्तम् अयते तदा ताराणि प्रकाशन्ते। तानि व्योम्नि हीरवत् द्योतन्ते। नक्षत्राणां राजा चन्द्रः। चन्द्रस्य प्रकाशः चन्द्रिका। अहं नक्षत्राणि गणयामि। किन्तु तानि गणयितुं न पारयामि। तानि असङ्ख्यानि वर्तन्ते। तत्र अश्विन्यादीनि सप्तविंशतिः नक्षत्राणि प्रधानानि॥

i. තරු නොබබළන්නේ කුමන අවස්ථාවේ දී ද?

ii. **नक्षत्राणि रात्रौ प्रकाशन्ते।** යන්නෙහි සිංහල අදහස ලියන්න.

iii. **अहं नक्षत्राणि गणयामि।** යන වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.

iv. **සඳ එළිය** යන අදහස ඇති සංස්කෘත වචනය ලියන්න.

v. සප්තමීවිභක්තියට අයත් නාමපද හතරක් ලියන්න.

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

अत्र एका वीणा अस्ति । गायकः वीणां वादयति । घण्टा कुत्र वर्तते ? घण्टा तत्र वर्तते । रामः घण्टां वादयति । घण्टायाः स्वरः परुषः । वीणायाः स्वरः मधुरः । मालती सम्यग् वीणां वादयति । मालविका मधुरं गायति । कोकिला वसन्ते मधुरं कूजति । गानेन सर्वे जनाः तुष्यन्ति ॥

i. වීණාවෙහි ශබ්දය කෙබඳු ද?
ii. गानेन सर्वे जनाः तुष्यन्ति । යන්නෙහි සිංහල අදහස ලියන්න.
iii. वादयति । गायति । कूजति । යන ක්‍රියාපද බහුවචනයට හරවා ලියන්න.
iv. अत्र, तत्र, कुत्र යන වචනවල තේරුම ලියන්න.
v. वसन्ते යන්නෙහි විභක්තිය, වචනය හා තේරුම ලියන්න.

05. පහත දැක්වෙන ශ්ලෝක සිංහල අකුරින් ලියන්න.

सर्वभाषासु या श्रेष्ठा - या चाढ्या शास्त्रसंचयैः ।
श्रेयं संस्कृतभाषा ते - भूयाद् वृद्ध्यै शिवाय च ॥

क्षणशः कणशश्चैव - विद्यामर्थं च साधयेत् ।
क्षणत्यागे कुतो विद्या - कणत्यागे कुतो धनम् ॥

विद्वत्वं च नृपत्वं च नैव तुल्यं कदाचन ।
स्वदेशे पूज्यते राजा विद्वान् सर्वत्र पूज्यते ॥

मत्स्याश्च जलमिच्छन्ति - धनमिच्छन्ति वाणिजाः ।
नीचाः कलहमिच्छन्ति - धर्ममिच्छन्ति पण्डिताः ॥

अजरामरवत् प्राज्ञो विद्यामर्थं च चिन्तयेत् ।
गृहीत इव केशेषु मृत्युना धर्ममाचरेत् ॥

धर्मादर्थः प्रभवति - धर्मात् प्रभवते सुखम् ।
धर्मेण लभते सर्वं - धर्मसारमिदं जगत् ॥

विप्राणां भूषणं विद्या पृथिव्या भूषणं नृपः ।
नभसो भूषणं चन्द्रः शीलं सर्वस्य भूषणम् ॥

उत्सवे व्यसने चैव दुर्भिक्षे राष्ट्रविप्लवे ।
राजद्वारे श्मशाने च यस्तिष्ठति स बान्धवः ॥

सुखार्थी चेत् त्यजेद्विद्यां - विद्यार्थी चेत् त्यजेत् सुखम् ।
सुखार्थिनः कुतो विद्या - कुतो विद्यार्थिनः सुखम् ॥

06. පහත දැක්වෙන ශ්ලෝක සම්පූර්ණ කරන්න.

1. යෝගීශ්වරං දශබලං ..................................................................
2. ආද්‍යං පවිත්‍රං සර්වීය ..................................................................
3. ජිතේන්ද්‍රියං ජිතක්ලේශං ..................................................................
4. මහාදේවං ..................................................................
5. මහාමතිං මහාවීර්‍යං ..................................................................
6. චතුර්මාරාරි විජිතං ..................................................................
7. නිර්වාදං නිරහඞ්කාරං ..................................................................
8. අත්‍යල්පමපි සාධූනාං ..................................................................
9. කලඞ්කමුක්තං කාමාරී ..................................................................
10. අර්ථා ගෘහෙ නිවර්තන්තෙ ..................................................................
11. නාස්ති විද්‍යා සමං මිත්‍රං ..................................................................
12. ජලබින්දුනිපාතේන ..................................................................
13. සාධෝඃ එරුෂවාක්‍යෙෂ්ච ..................................................................
14. ශික්ෂයන්ති න යාචන්තෙ ..................................................................
15. දුර්ජනෛඃ සහ සම්පර්කඃ ..................................................................
16. දෙයාණි තෘණපර්ණානි ..................................................................
17. ශ්‍රීඝනං ශ්‍රීමතිං ශ්‍රේෂ්ඨං ..................................................................
18. නමන්ති එලිනො වෘක්ෂාඃ ..................................................................

06. 01 පාඩමෙහි ඇතුළත් වර්තමානකාල ක්‍රියාපද 05 ක් අර්ථ සහිත ව ලියන්න.

- එම ක්‍රියාපද ද්විවචනයට හා බහුවචනයට හරවා ලියන්න.
- විවිධ විභක්තිවලට අයත් නාමපද 05 ක් සහ ඒවායෙහි අර්ථ අඩංගු වන සේ වගුවක් සකස් කරන්න. (නිදසුනක් පමණයි.)

# ඇගයීම හා තක්සේරුකරණය

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබ ගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එ සේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එ ලෙස තම සිසුන් ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන් ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන් ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ ද යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයා ගේ කාර්යභාරය යි. ඇගයීමේ(තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed Forward) යනුවෙනි. සිසුන් ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1. | පැවරුම් | 2. | ව්‍යාපෘති |
| 3. | සමීක්ෂණ | 4. | ගවේෂණ |
| 5. | නිරීක්ෂණ | 6. | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 7. | ක්ෂේත්‍ර චාරිකා | 8. | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. | ව්‍යුහගත රචනා | 10. | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. | ශ්‍රවණ පරීක්ෂණ |
| 13. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. | කථනය |
| 15. | ස්වනිර්මාණ | 16. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. | සංකල්ප සිතියම | 18. | ද්විත්ව සටහන් ජර්නල |
| 19. | බිත්ති පුවත්පත් | 20. | ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් |
| 21. | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. | විවාද |
| 23. | සාකච්ඡා මණ්ඩල | 24. | සම්මන්ත්‍රණ |
| 25. | ක්ෂණික කථා | 26. | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක් මත්, සෑම විෂයක් සම්බන්ධයෙන් මත්, සෑම විෂය ඒකකයකට මත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ පළමු වාරය

2. ආධාරක අංකය ඃ 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ 6.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ 6.1 නිර්දිෂ්ට ග්‍රන්ථවල ශ්ලෝක නිවැරදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

5. ආධාරකයේ ස්වභාවය ඃ පිටු පෙරළනයක් සැකසීම

6. ආධාරකයේ අරමුණු ඃ
   - නාමාෂ්ටශතකය පිළිබඳ දැනුවත් බව ඇති කිරීම
   - නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 වාචෝද්ගත කිරීම දිරි ගැන්වීම
   - නාමාෂ්ටශතකයේ ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලිවීමේ කුසලතාව තහවුරු කිරීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් ඃ

- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා එක් එක් කණ්ඩායමට වෙන වෙන ම නාමාෂ්ටශතකයේ ශ්ලෝක පවරා ඒ ඒ ශ්ලෝකය ඩිමයි කඩදාසියක දේවනාගරී අක්ෂරයෙන් ලියා පිටු පෙරළනයට එක් පිටුවක් බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.

- අදාළ පිටුව කැමැති පරිදි වර්ණ ගන්වා චිත්තාකර්ෂණීය ලෙස සැකසීමට යොදවන්න.

- පිටු සකස් කිරීමට නිශ්චිත කාල රාමුවක් ලබාදෙන්න.

- අදාළ පිළිවෙළට පිටු 18 අමුණා පිටු පෙරළනය ගොඩනැගීමට සිසුන්ට සහාය වන්න.

- පිටු පෙරළනය නිතර පරිහරණය කළ හැකි ස්ථානයක රඳවන්න.

- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ

- තම කණ්ඩායමට සකස් කිරීමට නියමිත ශ්ලෝක ගුරුවරයා හා සාකච්ඡා කොට තීරණය කරන්න.
- අකුරු හොඳින් ඉස්මතු වී ඇතට පෙනෙන සේ නිවැරදි දේවනාගරී අක්ෂර යොදා ගන්න.
- පිටු 18 පිළිවෙළට අමුණා පිටු පෙරළනය ගොඩනගන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

| නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| මාතෘකාවට අදාළ බව | | | | | | | | | |
| කරුණුවල නිවැරදි බව | | | | | | | | | |
| ලිපි පිළිවෙළ සැකසීම | | | | | | | | | |
| දත්තවල ප්‍රමාණාත්මක බව | | | | | | | | | |
| නිර්මාණාත්මක බව | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

ලකුණු පරාසය

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට අඩු | නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Test - 2018

2 ශ්‍රේණිය/**Grade 2**

**සංස්කෘත භාෂාව** **කාලය : පැය දෙකයි**

Sanskrit **විභාග අංකය :..........................................** Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න අටකට පමණක් පිළිතුරු සපයන්න.**

01. වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. හ්‍රස්ව ස්වර පමණක් ඇති වරණය කුමක් ද?

1. **आ इ उ ।** 2. **अ इ उ ।** 3. **ई उ अ ।**

ii. **त्** + **ऐ** එක් වීමෙන් සෑදෙන අක්ෂරය වන්නේ,

1. **तै** යන්නයි. 2. **ते** යන්නයි. 3. **तो** යන්නයි.

iii. කොම්බුව සහ ඇලපිල්ල යෙදී ඇති අක්ෂරය වන්නේ,

1. **मों** යන්නයි. 2. **मौ** යන්නයි. 3. **मो** යන්නයි.

iv. **तवर्ग** අකුරු පමණක් යෙදී ඇති වරණය වන්නේ,

1. **त थ ण** යන්නයි. 2. **त द न** යන්නයි. 3. **त द म** යන්නයි.

v. **मुनि** ශබ්දයේ තෘතීයා විභක්ති බහුවචන රූපය වන්නේ,

1. **मुनिभिः** යන්නයි. 2. **मुनीन्** යන්නයි. 3. **मुनिभ्यः** යන්නයි.

vi. **यूयम्** යන උක්තය සමග යෙදෙන ක්‍රියාපදයක් වන්නේ,

1. **पठसि** යන්නයි. 2. **पठथः** යන්නයි. 3. **पठथ** යන්නයි.

vii. පියාට යන අර්ථය ඇති සංස්කෘත වචනය වන්නේ,

1. **पित्रा** යන්නයි. 2. **पित्रे** යන්නයි. 3. **पितुः** යන්නයි.

viii. **अयच्छत्** යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

1. දෙයි යන්නයි. 2. දුන්නේ ය යන්නයි. 3. දෙන්නේ ය යන්නයි.

ix. **ගියෙමි** යන්නෙහි නිවැරදි සංස්කෘත වචනය වන්නේ,

1. **अगच्छम्** । යන්නයි. 2. **गच्छामि** । යන්නයි. 3. **गमिष्यामि** । යන්නයි.

x. **वृक्षात् पत्राणि पतन्ति** । ඉරි ඇඳි පදයේ නිවැරදි අර්ථය වන්නේ,

1. ගසේ යන්නයි. 2. ගසට යන්නයි. 3. ගසින් යන්නයි.

(ලකුණු 3 x 10 = 30 යි)

02. අ. පහත සඳහන් වචන **සිංහල අකුරින්** ලියන්න.

i. **मुनीन्द्रः** ............................

ii. **पूर्वकृत** ............................

iii. **छात्रः** ............................

iv. **विद्यालय** ............................

v. **सुभाषित** ............................

(ලකුණු 1 x 5 = 05 යි)

ආ. පහත දැක්වෙන වචන **දේවනාගරී අකුරින්** ලියන්න.

i. ලගුඩහස්තඃ ............................

ii. ආඛේටස්‍ය ............................

iii. දුර්භික්ෂ ............................

iv. ස්වගෘහාණි ............................

v. ප්‍රත්‍යාගච්ඡත් ............................

(ලකුණු 1 x 5 = 05 යි)

03. අ. පහත සඳහන් වචනවල **සිංහල තේරුම** ලියන්න.

i. **मार्जारः** ............................ ii. **मधुपाः** ............................

iii. **पितामहः** ............................ iv. **साधवे** ............................

v. **सभायाम्** ............................ (ලකුණු 1 x 5 = 05 යි)

ආ. පහත දැක්වෙන වචන සංස්කෘතයට නගා **දේවනාගරී අකුරින්** ලියන්න.

i. මිතුරෝ ............................

ii. පියා විසින් ............................

iii. යාචකයාට ............................

iv. පාසලෙන් ............................

v. නායකයන්ගේ ............................

(ලකුණු 1 x 5 = 05 යි)

**04.** පහත සඳහන් වාක්‍ය **සිංහලයට** නගන්න.

i. **अम्बा ओदनम् अपचत् ।** ............................................................

ii. **तस्य द्वे भार्ये आस्ताम् ।** ............................................................

iii. **अहं शीघ्रं पुनरागच्छामि ।** ............................................................

iv. **कपयः तरोः अवरोहन्ति ।** ............................................................

v. **विहगाः तरुषु नीडानि कुर्वन्ति ।** ............................................................

(ලකුණු 2 x 5 = 10 යි)

**05.** පහත සඳහන් වාක්‍ය **සංස්කෘතයට** නගා **දේවනාගරී අකුරින්** ලියන්න.

i. මම අතින් ලියමි. ............................................................

ii. ළමයි බුදුන් වැන්දාහ. ............................................................

iii. අයියා මල්ලීට තෑග්ගක් දෙයි. ............................................................

iv. ගොවියාගේ පුතා කුඹුරට ගියේ ය. ............................................................

v. ගුරුවරයා ශිෂ්‍යයා සමග පාසලට යයි. ............................................................

(ලකුණු 2 x 5 = 10 යි)

**06.** අ. සුදුසු පරිදි **හිස්තැන්** පුරවන්න.

| शब्द | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| बालक | सप्तमी | बालके | | बालकेषु |
| कवि | सप्तमी | | कव्योः | |
| साधु | सप्तमी | साधौ | साध्वोः | |
| पुष्प | सप्तमी | पुष्पे | | पुष्पेषु |

(ලකුණු 1 x 5 = 05 යි)

ආ. √**पच्** ධාතුව (**अपचत्**) අතීතකාල (ලඞ්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | अपचत् | | अपचन् |
| मध्यमपुरुष | | अपचतम् | |
| उत्तमपुरुष | | अपचाव | |

(ලකුණු 1 x 5 = 05 යි)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

**इह एकं पुस्तकम् एका पेटिका च स्तः। तत् कृष्णस्य 'शब्दमञ्जरी' पुस्तकम्। तस्य पुस्तकस्य मूल्यम् एको रूप्यकः। तस्मिन् पुस्तके द्विशतं पुटानि सन्ति। मम 'श्रीरामोदन्त' पुस्तके षष्टिः पुटानि सन्ति। अस्यां पेटिकायां कानि वस्तूनि विद्यन्ते। तस्यां पेटिकायां वस्त्राणि भूषणानि च विद्यन्ते। इयं हरेः पेटिका। स इमां कुञ्चिकया उद्घाटयति। कुञ्चिका हरेः गोपालस्य वा करे वर्तते॥**

i. මෙහි සඳහන් පෙට්ටියේ කුමන වස්තු විද්‍යමාන වේ ද?

..........................................................................................................

ii. ෂෂ්ඨී විභක්තියට අයත් නාමපද දෙකක් ඡේදයෙන් උපුටා ලියන්න.

..........................................................................................................

iii. **स इमां कुञ्चिकया उद्घाटयति।** යන්නෙහි සිංහල අදහස ලියන්න.

..........................................................................................................

iv. **पुस्तकम्** යන්න බහුවචනයට හරවා ලියන්න.

..........................................................................................................

v. '**අතෙහි**' යන අදහස දෙන සංස්කෘත වචනය ලියන්න.

..........................................................................................................

(ලකුණු 2 x 5 = 10 යි)

08. පහත සඳහන් සිංහල අදහසට ගැළපෙන සංස්කෘත පාඨය තෝරා ඉදිරියෙන් ලියන්න.

**केवलं पीयूषमेव।** **चिन्ता मास्तु।** **इदमासनम् अलङ्करोतु।**
**त्वं कः असि ?** **मधुरमिति किं कथयामि ?**

i. කරදර වෙන්න එපා.

..........................................................................................................

ii. එන්න වාඩි වෙන්න.

..........................................................................................................

iii. නුඹ කවරෙක් වෙහි ද?

..........................................................................................................

iv. මිහිරි යැයි කුමට කියම් ද?

…………………………………………………………………………………………

v. හුදෙක් අමෘතය (වගේ) මයි.

…………………………………………………………………………………………

(ලකුණු 2 x 5 = 10 යි)

09. අ. පහත දැක්වෙන **ශ්ලෝකය සිංහල අකුරින්** ලියන්න.

**पुस्तकस्था च या विद्या परहस्ते च यद्धनम् ।**

**कार्यकाले समायाते न सा विद्या न तद्धनम् ॥**

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(ලකුණු 04 යි)

ආ. පහත දැක්වෙන **ශ්ලෝක සම්පූර්ණ** කරන්න.

i. විපත්තිඃ කාලසඤ්ජාතා

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

ii. නමන්ති ඵලිනො වෘක්ෂාඃ

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(ලකුණු 3 x 2 = 06 යි)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018**<br>**Primary Piriven Mid Year Term Test - 2018**<br>2 ශ්‍රේණිය/**Grade 2**<br>**සංස්කෘත භාෂාව**   **කාලය : පැය දෙකයි**<br>Sanskrit   **විභාග අංකය :**.......................................... Time : Two hours |

**පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න අටකට පමණක් පිළිතුරු සපයන්න.**

01. වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. ස්වර අක්ෂර පමණක් ඇති වරණය කුමක් ද?
(1) **अ ओ आ।** (2) **अं अः आ।** (3) **इ उ ड।**

ii. **क्** + **ओ** එක් වීමෙන් සෑදෙන අක්ෂරය වන්නේ,
(1) **का** යන්නයි. (2) **कौ** යන්නයි. (3) **को** යන්නයි.

iii. දීර්ඝ ඉස්පිල්ල යෙදී ඇති අක්ෂරය වන්නේ,
(1) **गा** යන්නයි. (2) **गी** යන්නයි. (3) **गू** යන්නයි.

iv. **चवर्ग** ට පමණක් අයත් අකුරු යෙදී ඇති වරණය වන්නේ,
(1) **च ज ञ** යන්නයි. (2) **क ग ळ** යන්නයි. (3) **ट ड ण** යන්නයි.

v. **गज** ශබ්දයේ තෘතීයා විභක්ති බහුවචන රූපය වන්නේ,
(1) **गजान्** යන්නයි. (2) **गजेभ्यः** යන්නයි. (3) **गजैः** යන්නයි.

vi. **अहम्** යන උක්තය සමග යෙදෙන ක්‍රියාපදය වන්නේ,
(1) **गच्छसि** යන්නයි. (2) **गच्छामि** යන්නයි. (3) **गच्छामः** යන්නයි.

vii. **ළමයා විසින්** යන අර්ථය ඇති සංස්කෘත වචනය වන්නේ,
(1) **बालकेन** යන්නයි. (2) **बालकाय** යන්නයි. (3) **बालकात्** යන්නයි.

viii. **रथकारः** යන්න,
(1) ද්‍රව්‍ය නාමයකි. (2) පුද්ගල නාමයකි. (3) ස්ථාන නාමයකි.

ix. මධ්‍යමපුරුෂයට අයත් උක්තපදයක් වන්නේ,

(1) **तौ** යන්නයි. (2) **वयम्** යන්නයි. (3) **यूयम्** යන්නයි.

x. නපුංසක ලිංගයට අයත් නාමපදයක් වන්නේ මින් කුමක් ද?

(1) **अस्थि** (2) **मति** (3) **अग्रज**

(ලකුණු 2 x 10 = 20 යි)

02. අ. පහත සඳහන් වචන **සිංහල අකුරින්** ලියන්න.

i. **जायते** ............................
ii. **बुभुक्षा** ............................
iii. **मन्दं** ............................
iv. **ज्ञात्वा** ............................
v. **न्यग्रोधवृक्षः** ............................

(ලකුණු 1 x 5 = 05 යි)

ආ. පහත දැක්වෙන වචන **දේවනාගරී අකුරින්** ලියන්න.

i. චිත්‍රකෞ ............................
ii. පුනර්මිලාමඃ ............................
iii. අද්‍ය ............................
iv. ස්වීකුරු ............................
v. ප්‍රතස්ථෙ ............................

(ලකුණු 1 x 5 = 05 යි)

03. අ. පහත සඳහන් වචනවල **සිංහල තේරුම** ලියන්න.

i. **द्राक्षाफलम्** ............................
ii. **नायकेन** ............................
iii. **बालकाय** ............................
iv. **चटकः** ............................
v. **धनिकानाम्** ............................

(ලකුණු 1 x 5 = 05 යි)

ආ. පහත දැක්වෙන වචන සංස්කෘතයට නගා **දේවනාගරී අකුරින්** ලියන්න.

i. සිවලා ……………………….

ii. සත්පුරුෂයෝ ……………………….

iii. උදැල්ල ……………………….

iv. ඇමතිවරු ……………………….

v. ළමයාට ……………………….

(ලකුණු 1 x 5 = 05 යි)

**04.** පහත සඳහන් වාක්‍ය **සිංහලයට** නගන්න.

i. छात्रौ भिक्षुं नमतः।

……………………………………………………………………………………

ii. त्वं वृक्षम् आरोहसि।

……………………………………………………………………………………

iii. सत्यं जयति नानृतम्।

……………………………………………………………………………………

iv. एकः शृगालः वनं गच्छति।

……………………………………………………………………………………

v. अहं नेत्राभ्यां चित्रं पश्यामि।

……………………………………………………………………………………

(ලකුණු 2 x 5 = 10 යි)

05. පහත සඳහන් වාක්‍ය **සංස්කෘතයට නගා දේවනාගරී අකුරින්** ලියන්න.

i. අපි ගෙඩි කමු. ……………………...........…………………………………...

ii. පුතා සෙල්ලම් කරයි. …………..............………………………………………...

iii. සෙබළු යුද්ධය දිනති. ……………............………………………………………...

iv. ළමයි ගමින් නගරයට යති. ……..………………………………………...

v. පුත්තු රථවලින් ගෙදර එති. ………..……………………………………...

(ලකුණු 2 x 5 = 10 යි)

06. අ. සුදුසු පරිදි **හිස්තැන්** පුරවන්න.

| शब्द् | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| गज | प्रथमा | गजः | | गजाः |
| अज | तृतीया | | अजाभ्याम् | |
| मुनि | प्रथमा | मुनिः | मुनी | |
| कवि | द्वितीया | कविम् | | कवीन् |

(ලකුණු 1 x 5 = 05 යි)

ආ. √**पठ्** ධාතුව (**पठति**) වර්තමාන (ලට්) පරස්මෛපදයෙහි වරනගා දක්වන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | पठति | | पठन्ति |
| मध्यमपुरुष | | पठथः | |
| उत्तमपुरुष | | पठावः | |

(ලකුණු 1 x 5 = 05 යි)

07. පහත සඳහන් **ඡේදය කියවා** අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

**शाखायाः पर्णानि पतन्ति। मक्षिकाः पुष्पेभ्यः मधु पिबन्ति। बीजात् अङ्कुरः प्ररोहति। पात्रात् जलं स्रवति। धेनुः व्याघ्रात् त्रस्यति। अहं पीठात् उत्तिष्ठामि। त्वं तरोः अवरोहसि। पर्वतात् नदी प्रवहति। धनिकाः ग्रामात् नगरं गच्छन्ति। समुद्रात् जनाः रत्नानि आनयन्ति॥**

i. මිනිස්සු මුහුදෙන් කුමක් ගෙන එත් ද?

……………………………………………………………………………………………

ii. පඤ්චමී විභක්තියට අයත් නාමපද දෙකක් ලියන්න.

……………………………………………………………………………………………

iii. **अहं पीठात् उत्तिष्ठामि।** යන්නෙහි සිංහල අදහස ලියන්න.

……………………………………………………………………………………………

iv. **धनिकाः ग्रामात् नगरं गच्छन्ति।** යන්න ඒකවචනයට හරවා ලියන්න.

……………………………………………………………………………………………

v. **'දෙන කොටියාගෙන් බිය වෙයි.'** යන අදහස ඇති සංස්කෘත වාක්‍යය ලියන්න.

……………………………………………………………………………………………

(ලකුණු 2 x 5 = 10 යි)

08. පහත සඳහන් සිංහල අදහසට ගැළපෙන සංස්කෘත පාඨය තෝරා ඉදිරියෙන් ලියන්න.
**[ नमस्कारः। / स्वागतम्। / धन्यवादः। / विश्वासो नैव कर्तव्यम्। / त्रिशरणशरणमस्तु। ]**

i. ස්තුතියි. …………………………………………………………………

ii. ආයුබෝවන් ! …………………………………………………………………

iii. තෙරුවන් සරණයි. …………………………………………………………………

iv. සාදරයෙන් පිළිගනිමු. …………………………………………………………………

v. විශ්වාස නොකළ යුතු ම ය. …………………………………………………………………

(ලකුණු 2 x 5 = 10 යි)

09. අ. පහත දැක්වෙන ශ්ලෝකය සිංහල අකුරින් ලියන්න.

साधोः फरुषवाक्यैश्च न मनो याति विक्रियाम् ।
न हि तापयितुं शक्यं सागराम्भस्तृणोल्कया ॥

..............................................................................................................

..............................................................................................................

(ලකුණු 04 යි)

ආ. පහත දැක්වෙන ශ්ලෝක සම්පූර්ණ කරන්න.

i. මහාමතිං මහාවීර්‍යං

..............................................................................................................

..............................................................................................................

ii. අත්‍ථවාන් න කුලීනො'පි

..............................................................................................................

..............................................................................................................

(ලකුණු 3 x 2 = 06 යි)